සියලුම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

භෞතික විද්‍යාව I பௌதிகவியல் I Physics I	01 S I	පැය දෙකයි இரண்டு மணித்தியாலம் *Two hours*

උපදෙස් :

* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **50**ක්, පිටු **10**ක අඩංගු වේ.
* **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිලිමත්ව කියවන්න.
* **1** සිට **50** තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයකින්** (×) **ලකුණු කරන්න.**

ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

$(g = 10\,\mathrm{m\,s^{-2}})$

1. පහත සඳහන් යුගල අතුරෙන් සමාන මාන **නොමැත්තේ** කුමකට ද?
(1) ප්‍රත්‍යාබලය සහ පීඩනය
(2) ගම්‍යතාව සහ ආවේගය
(3) බලය සහ පෘෂ්ඨීක ආතතිය
(4) වේගය සහ ප්‍රවේගය
(5) කාර්යය සහ ශක්තිය

2. වර්නියර් කැලිපරයක් භාවිතයෙන් ලබාගත් යම් දිගක පාඨාංකයක් රූප සටහනේ දැක්වේ. මනින ලද දිග සහ උපකරණයේ කුඩාම මිනුම පිළිවෙළින් කොපමණ ද? වර්නියර් කැලිපරයට මූලාංක දෝෂයක් නොමැත.



(1) 1·206 cm සහ 0·001 cm
(2) 1·206 cm සහ 0·005 cm
(3) 1·260 cm සහ 0·001 cm
(4) 1·260 cm සහ 0·005 cm
(5) 1·260 cm සහ 0·010 cm

3. රූපයේ පෙන්වා ඇති පරිදි, ඝර්ෂණය රහිත තිරස් පෘෂ්ඨයක් මත 4 kg සහ 6 kg ස්කන්ධ සහිත කුට්ටි දෙකක් එකිනෙකට ස්පර්ශ වන පරිදි තබා ඇත. පද්ධතිය එක්ව චලනය වන පරිදි බරින් වැඩි ස්කන්ධය මත 5 N තිරස් බලයක් යොදන්නේ නම්, සැහැල්ලු ස්කන්ධය මත ක්‍රියාකරන බලයේ විශාලත්වය කොපමණ ද?



(1) 1 N
(2) 2 N
(3) 3 N
(4) 4 N
(5) 5 N

4. වාතයේ ධ්වනි වේගය
(1) උෂ්ණත්වයෙන් ස්වායත්ත වේ.
(2) පීඩනය වැඩිවීමත් සමග වැඩි වේ.
(3) පීඩනය වැඩිවීමත් සමග අඩු වේ.
(4) ආර්ද්‍රතාවය වැඩිවීමත් සමග අඩු වේ.
(5) ආර්ද්‍රතාවය වැඩිවීමත් සමග වැඩි වේ.

5. සරල අනුවර්තී චලිතයකට භාජනය වන අංශුවක මුළු ශක්තිය අනුලෝමව සමානුපාතික වන්නේ එහි
(1) ප්‍රවේගයට ය.
(2) ප්‍රවේගයේ වර්ගයට ය.
(3) විස්තාරයට ය.
(4) විස්තාරයේ වර්ගයට ය.
(5) සංඛ්‍යාතයට ය.

6. ක්වාර්ක (quarks) වර්ග කොපමණ තිබේ ද?
(1) 2
(2) 3
(3) 4
(4) 5
(5) 6

Past Papers Wiki

7. රූපයේ දැක්වෙන තරංග ආකාර දෙක මාධ්‍යයක එකම තලයක් ඔස්සේ ප්‍රතිවිරුද්ධ දිශාවලට ගමන් කරයි. O ලක්ෂ්‍යය C ලක්ෂ්‍යයට ළඟා වූ විට ලැබෙන සම්ප්‍රයුක්ත තරංග ආකාරයෙහි හැඩය කුමක් ද?





(1)



(2)



(3)



(4)



(5)

8. කෝෂයක වි.ගා. බලය වඩාත් නිවැරදිව මැනීම සඳහා සුදුසු උපාංගය පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) මීටර සේතුව (2) පරිපූර්ණ නොවන වෝල්ට්මීටරය
(3) ගැල්වනෝමීටරය (4) ඇමීටරය
(5) විභවමානය

9. ඒකාකාර ඝන ගෝලයක් නිශ්චලතාවයෙන් ආරම්භ වී ආනත තලයක් ඔස්සේ ලිස්සා යාමකින් තොරව පෙරළේ. කේන්ද්‍රය හරහා යන අක්ෂයක් වටා භ්‍රමණය වන ස්කන්ධය M සහ අරය R වන ඒකාකාර ඝන ගෝලයක අවස්ථිති ඝූර්ණය $I = \frac{2}{5}MR^2$ වේ. $\frac{\text{ගෝලයේ උත්තාරණ චාලක ශක්තිය}}{\text{ගෝලයේ භ්‍රමණ චාලක ශක්තිය}}$ අනුපාතය කොපමණ ද?

(1) $\frac{2}{5}$ (2) $\frac{1}{2}$ (3) 1 (4) $\frac{5}{2}$ (5) 4

10. විද්‍යුත් සමවිභව පෘෂ්ඨ පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.

(A) සමවිභව පෘෂ්ඨයක් මත විද්‍යුත් ක්ෂේත්‍ර තීව්‍රතාවය සැමවිටම නියත වේ.
(B) විද්‍යුත් ක්ෂේත්‍ර රේඛා සහ සමවිභව පෘෂ්ඨ සැමවිටම අන්‍යෝන්‍ය වශයෙන් ලම්බක වේ.
(C) සමවිභව පෘෂ්ඨ දෙකක් එකිනෙක සමග ඡේදනය නොවේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) (A) පමණක් සත්‍ය වේ.
(2) (A) සහ (B) පමණක් සත්‍ය වේ.
(3) (A) සහ (C) පමණක් සත්‍ය වේ.
(4) (B) සහ (C) පමණක් සත්‍ය වේ.
(5) (A), (B) සහ (C) සියල්ලම සත්‍ය වේ.

11. ඒකවර්ණ ආලෝක කිරණයක් වීදුරු කුට්ටියක් මත 60° ක පතන කෝණයකින් පතිත වේ. ආංශික වශයෙන් පරාවර්තනය වූ සහ වර්තනය වූ කිරණ එකිනෙකට ලම්බක නම්, වීදුරුවල වර්තනාංකය කොපමණ ද?

(1) 1·3 (2) 1·4 (3) 1·5 (4) $\sqrt{3}$ (5) 1·8

12. උස 21 cm වන සිලින්ඩරාකාර භාජනයක, ඉහළ සිට බලන විට එහි හරි අඩක් පිරී ඇති බව පෙනීම සඳහා භාජනයේ කොපමණ උසකට ජලය පිරවිය යුතු ද? ජලයේ වර්තනාංකය $\frac{4}{3}$ කි.

(1) 16·0 cm (2) 14·0 cm (3) 12·0 cm (4) 10·0 cm (5) 8·0 cm

13. විකිරණශීලී නියැදියක ස්කන්ධය වැඩි කළහොත්, නියැදියේ සක්‍රියතාවය සහ ක්ෂය නියතය පිළිවෙළින්

(1) වැඩි වේ, එලෙසම පවතී. (2) අඩු වේ, වැඩි වේ.
(3) අඩු වේ, එලෙසම පවතී. (4) වැඩි වේ, අඩු වේ.
(5) වැඩි වේ, වැඩි වේ.

[තුන්වැනි පිටුව බලන්න.

14. භාර දෙකක් දෑතින් අල්ලාගෙන සිටින ළමයෙක්, මධ්‍ය අක්ෂය වටා භ්‍රමණය වන වේදිකාවක ඇති පුටුවක් මත අත් නවාගෙන වාඩිවී සිටී. එවිට පද්ධතියේ භ්‍රමණ චාලක ශක්තිය K වේ. පද්ධතියේ අවස්ථිති ඝූර්ණය දෙගුණ වන පරිදි ළමයා දෑත් දිගු කරයි නම් පද්ධතියේ භ්‍රමණ චාලක ශක්තිය කුමක් වේ ද?

(1) $4K$ (2) $2K$ (3) K (4) $\frac{K}{2}$ (5) $\frac{K}{4}$

15. ඉදිකිරීම් ස්ථානයක ඇති විදුලි උත්පාදක යන්ත්‍රයක් යම් ලක්ෂ්‍යයක 50 dB ශබ්ද තීව්‍රතා මට්ටමක් ඇති කරයි. වෙනත් උපකරණයක ක්‍රියාකාරිත්වය හේතුවෙන්, එම ලක්ෂ්‍යයේ ශබ්ද තීව්‍රතාව මුල් අගය මෙන් 100 ගුණයක් බවට පත්වේ. එම ලක්ෂ්‍යයේ නව ශබ්ද තීව්‍රතා මට්ටම කොපමණ ද?

(1) 50 dB (2) 60 dB (3) 70 dB (4) 80 dB (5) 150 dB

16. සංයුක්ත අන්වීක්ෂයක් සහ නක්ෂත්‍ර දුරේක්ෂයක් සාමාන්‍ය සීරුමාරුවේ පවතී. ඒවායේ අවනෙත් කාචවල නාභීය දුර වැඩි කළහොත්, පිළිවෙළින් අන්වීක්ෂයේ සහ දුරේක්ෂයේ විශාලක බලයට කුමක් සිදුවේ ද?

(1) වැඩි වේ, අඩු වේ
(2) අඩු වේ, වැඩි වේ
(3) එලෙසම පවතී, වැඩි වේ
(4) වැඩි වේ, වැඩි වේ
(5) අඩු වේ, අඩු වේ

17. හීලියම් වායුවෙන් පුරවන ලද බැලූනයක පරිමාව $500\,\mathrm{m^3}$ වේ. බැලූනය මගින් ඉහළට එසවිය හැකි විශාලතම ස්කන්ධය කොපමණ ද? බැලූනයේ ද්‍රව්‍යයේ ස්කන්ධය නොසලකා හරින්න. වාතයේ සහ හීලියම්වල ඝනත්ව පිළිවෙළින් $1{\cdot}28\,\mathrm{kg\,m^{-3}}$ සහ $0{\cdot}18\,\mathrm{kg\,m^{-3}}$ වේ.

(1) 400 kg (2) 550 kg (3) 600 kg (4) 700 kg (5) 750 kg

18. විවිධ තාපගතික ක්‍රියාවලීන් මගින් පරිපූර්ණ වායුවක් අඩු පරිමාවක සිට වැඩි පරිමාවක් දක්වා ප්‍රසාරණය වේ. පහත ප්‍රකාශ සලකා බලන්න.

(A) ප්‍රසාරණය සමපීඩන වන විට වායුව මගින් සිදු කරන කාර්යය ප්‍රමාණය උපරිම වේ.
(B) ප්‍රසාරණය ස්ථිරතාපී වන විට වායුව මගින් අවශෝෂණය කරන තාපය උපරිම වේ.
(C) ප්‍රසාරණය සමෝෂ්ණ වන විට වායුවේ අභ්‍යන්තර ශක්තියේ වෙනස උපරිම වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) (A) පමණක් සත්‍ය වේ.
(2) (A) සහ (B) පමණක් සත්‍ය වේ.
(3) (A) සහ (C) පමණක් සත්‍ය වේ.
(4) (B) සහ (C) පමණක් සත්‍ය වේ.
(5) (A), (B) සහ (C) සියල්ලම සත්‍ය වේ.

19. අංශුවක ප්‍රවේගය (v) - කාලය (t) ප්‍රස්තාරය රූපයේ පෙන්වයි. අංශුවේ ශුද්ධ විස්ථාපනය කොපමණ ද?



(1) 18 m
(2) 12 m
(3) 6 m
(4) 3 m
(5) 0

20. පරිපථයේ පෙන්වා ඇති ඇමීටරයේ පාඨාංකය කොපමණ ද?



(1) 0
(2) 1 A
(3) 2 A
(4) 3 A
(5) 4 A

Past Papers Wiki

21. රූපයේ දැක්වෙන පරිදි M ස්කන්ධයක් සැහැල්ලු සිරස් දුන්නක් මගින් දෘඪ ආධාරකයකට සවිකොට ඇත. දෙවන m ස්කන්ධයක් සැහැල්ලු තන්තුවක් මගින් M ට සම්බන්ධ කර ඇත $(M > m)$. පද්ධතිය සමතුලිතතාවයේ පවතින විට, තන්තුව ක්ෂණිකව කපා දමනු ලැබේ.



පහත ප්‍රකාශ සලකා බලන්න.

(A) තන්තුව කැපූ වහාම දුන්නේ ආතතිය Mg බවට පත්වේ.

(B) තන්තුව කැපූ වහාම M ස්කන්ධය g ට වඩා අඩු විශාලත්වයකින් යුතුව ඉහළට ත්වරණය වේ.

(C) අවසානයේදී M ස්කන්ධය එහි නව සමතුලිතතා පිහිටුම වටා සරල අනුවර්තී චලිතයක් සිදු කිරීමට පටන් ගනී.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) (A) පමණක් සත්‍ය වේ.
(2) (A) සහ (B) පමණක් සත්‍ය වේ.
(3) (A) සහ (C) පමණක් සත්‍ය වේ.
(4) (B) සහ (C) පමණක් සත්‍ය වේ.
(5) (A), (B) සහ (C) සියල්ලම සත්‍ය වේ.

22. සෙල්ලම් බෝට්ටුවක් සිලින්ඩරාකාර ජල භාජනයක පාවේ. සමාන ස්කන්ධවලින් යුත් A සහ B කුට්ටි දෙකක් බෝට්ටුව තුළ ඇත. A සහ B හි ද්‍රව්‍යවල ඝනත්ව පිළිවෙළින් $600\,kg\,m^{-3}$ සහ $1200\,kg\,m^{-3}$ වේ. භාජනයේ ජල මට්ටමේ උස h වේ.

පහත අවස්ථා දෙක සලකා බලන්න.

I අවස්ථාව: A කුට්ටිය බෝට්ටුවෙන් ඉවත් කර ජල මතුපිට තැබූවිට එය පාවෙන අතර, B බෝට්ටුව තුළම පවතී.

II අවස්ථාව: B කුට්ටිය බෝට්ටුවෙන් ඉවත් කර ජල මතුපිට තැබූවිට එය ගිලෙන අතර, A බෝට්ටුව තුළම පවතී.

භාජනයේ ජල මට්ටමේ උස සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශවලින් සත්‍ය වන්නේ කුමක් ද?

(1) එය I අවස්ථාවෙහිදී h ට වඩා වැඩි වන අතර II අවස්ථාවෙහිදී h ට වඩා අඩු වේ.
(2) එය I සහ II අවස්ථා දෙකෙහිදීම h ට වඩා වැඩි වේ.
(3) එය I අවස්ථාවෙහිදී h හි පවතින අතර II අවස්ථාවෙහිදී h ට වඩා අඩු වේ.
(4) එය I සහ II අවස්ථා දෙකෙහිදීම h හි පවතී.
(5) එය I අවස්ථාවෙහිදී h හි පවතින අතර II අවස්ථාවෙහිදී h ට වඩා වැඩි වේ.

23. රූපයේ දැක්වෙන පරිදි විශාල හරස්කඩ වර්ගඵලයක් ඇති ටැංකියක මිශ්‍ර නොවන ද්‍රව දෙකක් අඩංගු වේ. ටැංකියේ පහළ අර්ධය $0{\cdot}5\,m$ ක උසකට $1000\,kg\,m^{-3}$ ඝනත්වයකින් යුත් ජලයෙන් පිරී ඇති අතර, ඉහළ අර්ධය $0{\cdot}5\,m$ ක උසකට $500\,kg\,m^{-3}$ ඝනත්වයකින් යුත් තෙල්වලින් පිරී ඇත. ටැංකිය වායුගෝලයට විවෘතව ඇත. A සහ B කුඩා බිහිදොර දෙකක් ටැංකියට සවි කර ඇත්තේ A ටැංකියේ පතුලේ සහ B තෙල්-ජල අතුරුමුහුණතට මඳක් ඉහළින් ඇති ආකාරයටය. ජලය v_A වේගයකින් A බිහිදොර හරහා ඉවතට ගලා යන අතර, තෙල් v_B වේගයකින් B බිහිදොර හරහා ඉවතට ගලා යයි. මෙම මොහොතේදී $\frac{v_A}{v_B}$ අනුපාතය කොපමණ ද? ද්‍රව දුස්ස්‍රාවී නොවන බව උපකල්පනය කරන්න.



(1) $\sqrt{\frac{7}{2}}$ (2) $\sqrt{\frac{5}{2}}$ (3) $\sqrt{\frac{3}{2}}$ (4) $\sqrt{\frac{2}{3}}$ (5) $\sqrt{\frac{1}{2}}$

24. සමාන පරිමාවකින් යුත් මුද්‍රා තැබූ සිලින්ඩර දෙකක් එකම උෂ්ණත්වයේ තබා ඇත. එක් සිලින්ඩරයක ආගන් වායුව අඩංගු වන අතර අනෙකෙහි නියොන් වායුව අඩංගු වේ. ආගන්වල සාපේක්ෂ පරමාණුක ස්කන්ධය නියොන්වලට වඩා වැඩිය. වායු දෙකම පරිපූර්ණ ලෙස හැසිරෙන බව උපකල්පනය කරන්න.

පහත ප්‍රකාශ සලකා බලන්න.

(A) සිලින්ඩර දෙකෙහිම වායු පරමාණුවල මධ්‍යන්‍ය උත්තාරණ චාලක ශක්තිය සමාන වේ.

(B) ආගන් පරමාණුවල වර්ග මධ්‍යන්‍ය මූල වේගය නියොන් පරමාණුවලට වඩා වැඩි ය.

(C) සිලින්ඩර දෙකෙහිම වායු පරමාණු ගණන සමාන නම්, සිලින්ඩර තුළ ඇති වායු පීඩන සමාන වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) (A) පමණක් සත්‍ය වේ.
(2) (A) සහ (B) පමණක් සත්‍ය වේ.
(3) (A) සහ (C) පමණක් සත්‍ය වේ.
(4) (B) සහ (C) පමණක් සත්‍ය වේ.
(5) (A), (B) සහ (C) සියල්ලම සත්‍ය වේ.

[පස්වැනි පිටුව බලන්න.

25. රූපයේ දැක්වෙන පරිදි පාරදෘශ්‍ය මාධ්‍ය දෙකක අතුරුමුහුණත මතට θ පතන කෝණයක් සහිතව ඒකවර්ණ ආලෝක කිරණයක් පතිත වේ. θ යන්තමින් වැඩි කළ විට කිරණය පූර්ණ අභ්‍යන්තර පරාවර්තනයට භාජනය වේ. ඉහත අවස්ථා දෙකෙහිදී නික්මයන කිරණ දෙක අතර කෝණය කුමක් ද?



(1) $90° - 2\theta$ (2) $90° - \theta$ (3) $180° - 2\theta$ (4) $180° - \theta$ (5) 2θ

26. පහත ප්‍රකාශ සලකා බලන්න.

(A) නියත වේගයකින් ගමන් කරන අතරතුර වස්තුවක් ත්වරණය විය හැක.

(B) වස්තුවක ප්‍රවේගය ශුන්‍ය වන අවස්ථාවකදී පවා එයට ත්වරණයක් තිබිය හැක.

(C) වස්තුවක් එහි ප්‍රවේගයට ප්‍රතිවිරුද්ධ දිශාවට ත්වරණය විය හැක.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) (A) පමණක් සත්‍ය වේ. (2) (A) සහ (B) පමණක් සත්‍ය වේ.
(3) (A) සහ (C) පමණක් සත්‍ය වේ. (4) (B) සහ (C) පමණක් සත්‍ය වේ.
(5) (A), (B) සහ (C) සියල්ලම සත්‍ය වේ.

27. අරය r වන කුඩා ගෝලාකාර බෝලයක් නිශ්චලතාවයෙන් ආරම්භ වී ජලය සහිත ටැංකියකට ඇතුළු වීමට පෙර වාතයේ h උසක් හරහා ගුරුත්වාකර්ෂණය යටතේ නිදහසේ වැටේ. වායු ප්‍රතිරෝධය නොසලකා හරින්න. කිසිදු ශක්ති හානියක් නොමැතිව බෝලය v ප්‍රවේගයකින් ජලයට ඇතුළු වේ. ජලයට ඇතුළු වූ පසු, බෝලයේ ප්‍රවේගය ටැංකියේ පතුලට ළඟා වන තෙක් v හි නියතව පවතී නම්, h සමානුපාතික වන්නේ

(1) r ටය. (2) r^2 ටය. (3) r^3 ටය. (4) r^4 ටය. (5) r^5 ටය.

28. රූපයේ දැක්වෙන්නේ යකඩ සහ පිත්තලවලින් සාදන ලද ද්විලෝහ පටියකි. එක් එක් පටියේ වම් කෙළවර එකට සවි කර ඇති අතර අනෙක් කෙළවර නිදහස්ව පවතී. ඒවායේ දිග අතර වෙනස 10 cm කි. උෂ්ණත්වය ඉහළ යාමත් සමග මෙම වෙනස නියතව පැවතීමට නම්, පිත්තල පටියේ දිග කොපමණ විය යුතුද? යකඩ සහ පිත්තලවල රේඛීය ප්‍රසාරණතා පිළිවෙළින් $1{\cdot}2 \times 10^{-5}\,K^{-1}$ සහ $1{\cdot}8 \times 10^{-5}\,K^{-1}$ වේ.



(1) 5 cm (2) 10 cm (3) 15 cm (4) 20 cm (5) 25 cm

29. S – R පිළිපොළක ප්‍රතිදානය $Q = 1$ හි පවතී. $S = 1, R = 1$ ලෙස ප්‍රදාන එකවර කෙටි කාලයකට සැකසීමෙන් පසු, ප්‍රදාන දෙකම 0 ලෙස සකසන ලදී. දැන් පිළිපොළෙහි ප්‍රතිදාන අවස්ථාව පිළිබඳව පහත නිගමනයන්ගෙන් සත්‍ය වන්නේ කුමක් ද?

(1) එය නිසැකවම $Q = 1$ ලෙස සැකසේ.
(2) එය නිසැකවම $Q = 0$ ලෙස සැකසේ.
(3) එහි ප්‍රතිදාන අවස්ථාව පුරෝකථනය කළ නොහැක.
(4) Q නිසැකවම $Q = 1 \rightarrow Q = 0 \rightarrow Q = 0$ අනුපිළිවෙළ අනුගමනය කරයි.
(5) Q නිසැකවම $Q = 1 \rightarrow Q = 1 \rightarrow Q = 1$ අනුපිළිවෙළ අනුගමනය කරයි.

30. උස l වන ඒකාකාර සිරස් සිලින්ඩරාකාර භාජනයක පතුලට පමණක් නොසැලකිය හැකි ස්කන්ධයක් ඇත. මුලදී සිලින්ඩරය හිස්ව ඇති අතර ක්‍රමයෙන් නියත ශීඝ්‍රතාවකින් සිලින්ඩරයට ජලය වත් කරනු ලැබේ. ජලයේ උස h සමග සිලින්ඩරයේ පතුලේ සිට මනිනු ලබන පද්ධතියේ ගුරුත්ව කේන්ද්‍රයේ උස y හි විචලනය වඩාත් හොඳින් නිරූපණය කරන්නේ පහත කුමන ප්‍රස්තාරය ද?



(1)



(2)



(3)



(4)



(5)

31. තාප ධාරිතාව $50\,J\,K^{-1}$ වන කැලරිමීටරයක් තුළ $0{\cdot}25\,kg$ ස්කන්ධයක් ඇති ද්‍රවයක් අඩංගු වේ. $10\,W$ ගිල්ලුම් තාපකයක් ද්‍රවයේ බහා ඇත. ගිල්ලුම් තාපකය ක්‍රියාත්මක කර යම් වේලාවකට පසු ද්‍රවයේ උෂ්ණත්වය ස්ථාවර අගයකට ළඟා වේ. දැන් තාපකය ක්‍රියා විරහිත කළ විට ද්‍රවයේ ආරම්භක උෂ්ණත්වය පහත වැටීමේ ශීඝ්‍රතාවය $1{\cdot}0 \times 10^{-2}\,K\,s^{-1}$ බව නිරීක්ෂණය කරන ලදී. ද්‍රවයේ විශිෂ්ට තාප ධාරිතාව කොපමණ ද?

(1) $3000\,J\,kg^{-1}\,K^{-1}$ (2) $3500\,J\,kg^{-1}\,K^{-1}$ (3) $3800\,J\,kg^{-1}\,K^{-1}$
(4) $4000\,J\,kg^{-1}\,K^{-1}$ (5) $4500\,J\,kg^{-1}\,K^{-1}$

32. ඝර්ෂණය රහිත කප්පියක එල්ලා ඇති චලනය විය හැකි වේදිකාවක් මත සිටගෙන සිටින ළමයකු තමාව නියත වේගයකින් ඉහළට ඇද ගන්නා ආකාරය (1) රූපයෙහි දැක්වේ. බිම සිටගෙන සිටින තවත් ළමයකු විසින් වේදිකාව මත සිටින ළමයා නියත වේගයකින් ඉහළට අදින ආකාරය (2) රූපයෙහි දැක්වේ. ලණු ස්කන්ධයෙන් තොර සහ අවිතන්‍ය බව උපකල්පනය කරන්න.

පහත ප්‍රකාශ සලකා බලන්න.

(A) (1) රූපයේ ළමයා විසින් යොදන බලය (2) රූපයේ බිම මත සිටින ළමයා විසින් යොදන බලයෙන් හරි අඩකි.

(B) එකම උසකින් ඉහළට යාමට, (1) රූපයේ ළමයා විසින් කරන කාර්යය, (2) රූපයේ බිම මත සිටින ළමයා විසින් කරන කාර්යයට වඩා අඩුය.

(C) වේදිකාවේ සිටගෙන සිටින ළමයා මත වේදිකාවෙන් ක්‍රියා කරන ප්‍රතික්‍රියා බල අවස්ථා දෙකේදීම සමාන වේ.



(1) රූපය (2) රූපය

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) (A) පමණක් සත්‍ය වේ. (2) (A) සහ (B) පමණක් සත්‍ය වේ.
(3) (A) සහ (C) පමණක් සත්‍ය වේ. (4) (B) සහ (C) පමණක් සත්‍ය වේ.
(5) (A), (B) සහ (C) සියල්ලම සත්‍ය වේ.

33. තරු පද්ධතියක් සමාන M ස්කන්ධයෙන් යුත් ඒකරේඛීය තාරකා තුනකින් සමන්විත වේ. සහායක තාරකා දෙක මධ්‍යම තාරකාව වටා අරය R වූ වෘත්තාකාර කක්ෂයක ගමන් කරයි. මධ්‍යම තාරකාවට සාපේක්ෂව සහායක තාරකාවක රේඛීය වේගය කුමක් ද?

(1) $\frac{1}{2}\sqrt{\frac{GM}{R}}$ (2) $\frac{1}{\sqrt{2}}\sqrt{\frac{GM}{R}}$ (3) $\frac{\sqrt{3}}{2}\sqrt{\frac{GM}{R}}$ (4) $\sqrt{\frac{GM}{R}}$ (5) $\frac{\sqrt{5}}{2}\sqrt{\frac{GM}{R}}$

34. රූපයේ දැක්වෙන පරිදි සිරස්ව පහළට ක්‍රියාකරන ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයක් හරහා තුනී සන්නායක තහඩුවක් තිරස්ව පිටතට ඇදගෙන යනු ලැබේ. පහත රූප සටහන් අතුරෙන් තහඩුව තුළ ප්‍රේරණය වන සුළි ධාරාවල දිශා නිවැරදිව නිරූපණය කරන්නේ කුමකින් ද?



35. අනන්ත දිගකින් යුත් සමාන්තර කම්බි දෙකක් සමාන ධාරා එකම දිශාවක් ඔස්සේ කඩදාසියේ තලය තුළට රැගෙන යයි. හටගන්නා වූ චුම්බක ක්ෂේත්‍ර රේඛාවල රටාව වඩාත් හොඳින් නිරූපණය කරන්නේ පහත දැක්වෙන කුමන රූප සටහනෙන් ද?



(1)



(2)



(3)



(4)



(5)

36. ස්කන්ධය M සහ දිග L වන බර ඒකාකාර දණ්ඩක්, දණ්ඩේ එක් එක් කෙළවරට සම්බන්ධ කර ඇති සිරස් කම්බි දෙකකින් දෘඪ සිවිලිමක එල්ලා ඇත. කම්බිවල නොඇදුනු දිග සහ හරස්කඩ වර්ගඵලය පිළිවෙළින් l සහ A වේ. එක් කම්බියක් තඹවලින් සාදා ඇති අතර අනෙක පිත්තලවලින් සාදා ඇත. තඹ සහ පිත්තලවල යං මාපාංක පිළිවෙළින් E_C සහ E_B $(E_C > E_B)$ වේ. රූපයේ දැක්වෙන දණ්ඩ තිරසට සාදන θ කෝණය (රේඩියනවලින්) කුමක්ද? (ඉඟියː රේඩියනවලින් මනින ලද කුඩා θ කෝණයක් සඳහා $\sin\theta = \theta$)



(1) $\frac{Mgl}{4AL}\left(\frac{1}{E_B}-\frac{1}{E_C}\right)$ (2) $\frac{Mgl}{2AL}\left(\frac{1}{E_B}-\frac{1}{E_C}\right)$ (3) $\frac{Mgl}{AL}\left(\frac{1}{E_B}-\frac{1}{E_C}\right)$

(4) $\frac{MgL}{2Al}\left(\frac{1}{E_B}-\frac{1}{E_C}\right)$ (5) $\frac{MgL}{Al}\left(\frac{1}{E_B}-\frac{1}{E_C}\right)$

37. R ප්‍රතිරෝධයක් සමග ශ්‍රේණිගතව ඇති පරිපූර්ණ දියෝඩයක් සහිත පරිපථයක් (1) රූපයෙහි පෙන්වා ඇත. (2) රූපයෙහි දැක්වෙන පරිදි A සහ B අග්‍ර අතර, විස්තාරය V_0 වන හතරැස් තරංගයක ස්වරූපයෙන් ඇති සැපයුම් වෝල්ටීයතාවයක් යොදනු ලැබේ. එක් චක්‍රයක් තුළ R ප්‍රතිරෝධය හරහා ක්ෂමතා උත්සර්ජනයේ සාමාන්‍ය අගය කුමක් ද?



(1) රූපය



(2) රූපය

(1) 0 (2) $\frac{V_0^2}{4R}$ (3) $\frac{V_0^2}{2R}$ (4) $\frac{V_0^2}{R}$ (5) $\frac{2V_0^2}{R}$

38. විෂ්කම්භය $1{\cdot}0\,\text{mm}$ වන ඒකාකාර කම්බියක් රූපයේ දැක්වෙන පරිදි නවා, වෘත්තාකාර පුඩුවක් සාදා ඇත. වෘත්තාකාර පුඩුවේ අරය $10\,\text{cm}$ ක් වේ. කම්බියේ ද්‍රව්‍යයේ ප්‍රතිරෝධකතාව $3{\cdot}0 \times 10^{-4}\,\Omega\,\text{m}$ වේ. සන්නායක කම්බි දෙකක් A සහ B ලක්ෂ්‍යවලදී පුඩුවට සම්බන්ධ කර ඇත්තේ B ලක්ෂ්‍යයට පුඩුව වටා සර්පණය විය හැකි වන පරිදිය. A සහ B ලක්ෂ්‍ය අතර පැවතිය හැකි උපරිම ප්‍රතිරෝධය කොපමණ ද?



(1) $30\,\Omega$ (2) $40\,\Omega$ (3) $50\,\Omega$
(4) $60\,\Omega$ (5) $80\,\Omega$

39. රූප සටහනේ පෙන්වා ඇති ට්‍රාන්සිස්ටරයේ ධාරා ලාභය $\beta = 20$, $V_{BE} = 0{\cdot}5\,V$, සහ V_{CE} (සන්තෘප්ත) $= 0\,V$ වේ. ට්‍රාන්සිස්ටරය සන්තෘප්ත ආකාරයේ ක්‍රියා කිරීමට අවශ්‍ය R_B හි අවම අගය කොපමණ ද?



(1) 120 Ω (2) 240 Ω
(3) 540 Ω (4) 1·0 kΩ
(5) 1·1 kΩ

40. ප්‍රකාශවිද්‍යුත් පරීක්ෂණාත්මක ඇටවුමක කැතෝඩය ආලෝක ප්‍රභවයකින් ප්‍රදීපනය කරනු ලැබේ. ආලෝක කදම්බයේ තීව්‍රතාව නියතව තබා ගනිමින් පතන ආලෝකයේ සංඛ්‍යාතය (f) වැඩි කරන ලදී. f සමග ප්‍රකාශ ධාරාවේ (I) විචලනය වඩාත් හොඳින් නිරූපණය කරන්නේ පහත කුමන ප්‍රස්තාරයේ ද?



41. දෙකෙළවර දෘඪව සවි කර ඇති ඒකාකාර වානේ කම්බියක් 750 N ආතතියකට යටත් කොට ඇත. කම්බියේ දිග 0·4 m ක් වන අතර ස්කන්ධය 0·3 g වේ. 10 000 Hz දක්වා සංඛ්‍යාත ශ්‍රවණය කළ හැකි පුද්ගලයකුට ඇසිය හැකි මෙම කම්බියෙන් නිපදවන ඉහළම ප්‍රසංවාදය කුමක් ද?

(1) 4 (2) 5 (3) 6 (4) 7 (5) 8

42. රූපයේ පෙන්වා ඇති පරිදි සංයුක්ත ලෝහ දණ්ඩක් ක්‍රමයෙන් අඩු වන AB හරස්කඩ කොටසකින් සහ ක්‍රමයෙන් වැඩි වන BC හරස්කඩ කොටසකින් සමන්විත වේ. දණ්ඩ සම්පූර්ණයෙන්ම අවුරා ඇති අතර දෙකෙළවර පිළිවෙළින් θ_1 සහ θ_2 $(\theta_1 > \theta_2)$ උෂ්ණත්වවල පවත්වාගෙන ඇත. අනවරත අවස්ථාවේදී, දණ්ඩේ අක්ෂය දිගේ d දුර සමග දණ්ඩේ උෂ්ණත්වය θ හි විචලනය වඩාත් හොඳින් නිරූපණය කරන්නේ පහත කුමන ප්‍රස්තාරය ද?





43. $+Q$ ආරෝපණයක් ඇති R අරයක් සහිත ඝන සන්නායක ගෝලයක්, $+Q$ ආරෝපණයක් ඇති $2R$ අරයක් සහිත **ඉතා තුනී** පරිවාරක කබොලක් සමග ඒක කේන්ද්‍රියව තබා ඇත. ආරෝපණය පරිවාරක කබොල මත ඒකාකාරව ව්‍යාප්තව ඇත. පොදු කේන්ද්‍රයේ සිට r අරීය දුර සමග E විද්‍යුත් ක්ෂේත්‍ර තීව්‍රතාවයෙහි විචලනය වඩාත් හොඳින් නිරූපණය කරන්නේ පහත කුමන ප්‍රස්තාරය ද?



(1)



(2)



(3)



(4)



(5)

44. පැත්තක දිග L වන සමචතුරස්‍රාකාර සන්නායක තහඩු දෙකක් අතර පරතරය d වේ. රූපයේ දැක්වෙන පරිදි, තහඩු අතර අවකාශයට පැති දිග L සහ ඝනකම d සහිත පාරවිද්‍යුත් නියතය k වන පාරවිද්‍යුත් පුවරුවක් x දුරක් දක්වා ඇතුල් කරනු ලැබේ. පද්ධතියේ සඵල ධාරණාව කුමක් ද?



(1) $\frac{\varepsilon_0 L}{d}\left[L+(k-1)x\right]$

(2) $\frac{\varepsilon_0 L}{d}\left[L+kx\right]$

(3) $\frac{\varepsilon_0 k(L-x)x}{d}$

(4) $\frac{\varepsilon_0 kLx}{d}$

(5) $\frac{2\varepsilon_0 L}{d}\left[L+(k-1)x\right]$

45. අනන්ත දිගක් සහිත ඍජු කම්බියක් නියත I ධාරාවක් රැගෙන යයි. ඍජුකෝණාස්‍රාකාර සන්නායක පුඩුවක් රූපයේ පෙන්වා ඇති පරිදි කාලය $t=0$ දී v නියත ප්‍රවේගයෙන් චලනය වීමට පටන් ගන්නේ d පරතරය නියතව තබා ගනිමිනි. කම්බිය සහ පුඩුව එකම තලයක පිහිටා ඇත. කාලය t සමග පුඩුවේ ප්‍රේරණය වන ධාරාව i හි විචලනය වඩාත් හොඳින් නිරූපණය කරන්නේ පහත කුමන ප්‍රස්තාරය ද?





(1)



(2)



(3)



(4)



(5)

46. වාතය පිඹීමෙන් සබන් බුබුලක අරය r සිට $2r$ දක්වා සමෝෂ්ණ ලෙස වැඩි කළ විට, බුබුලේ පෘෂ්ඨීය ශක්තිය E_1 ප්‍රමාණයකින් වැඩි වේ. එම සබන් ද්‍රාවණයෙන්ම සාදන ලද අරය r වන සමාන සබන් බුබුලු දෙකක් ඒකාබද්ධ වී තනි බුබුලක් සාදන විට පෘෂ්ඨීය ශක්තිය E_2 ප්‍රමාණයකින් අඩු වේ. $\frac{E_1}{E_2}$ අනුපාතයේ විශාලත්වය කුමක් ද?

(1) $\frac{3}{2-2^{\frac{2}{3}}}$ (2) $\frac{4}{2-2^{\frac{2}{3}}}$ (3) $\frac{3}{2-2^{\frac{1}{3}}}$ (4) $\frac{4}{2-2^{\frac{1}{3}}}$ (5) $\frac{3}{2^{\frac{2}{3}}}$

47. සර්වසම නොවූ එන්ජින් දෙකක් සහිත ගුවන් යානයක් ස්ථාවර නිරීක්ෂකයකුට ඉහළින් අඩු උන්නතාංශයක සෘජු තිරස් මාර්ගයක් ඔස්සේ නියත වේගයකින් පියාසර කරයි. ගුවන් යානය පියාසර කරන විට එන්ජින් දෙකෙන් නිරීක්ෂකයාට ඇසෙන නුගැසුම් සංඛ්‍යාතය 8 Hz සිට 2 Hz දක්වා වෙනස් වේ. ගුවන් යානය නිරීක්ෂකයා දෙසට සහ ඉවතට ගමන් කරන වේගය ගුවන් යානයේ සැබෑ වේගයට සමාන බව උපකල්පනය කරන්න. ගුවන් යානයේ වේගය කොපමණද? (වාතයේ ධ්වනි වේගය $330\,\mathrm{m\,s^{-1}}$ කි)

(1) $100\,\mathrm{m\,s^{-1}}$ (2) $125\,\mathrm{m\,s^{-1}}$ (3) $150\,\mathrm{m\,s^{-1}}$ (4) $195\,\mathrm{m\,s^{-1}}$ (5) $198\,\mathrm{m\,s^{-1}}$

48. මුළු ස්කන්ධය M වන තඹ පියනක් සහිත උණුසුම් තඹ භාජනයක් θ_1 උෂ්ණත්වයක පවතී. θ_2 ($\theta_2 < \theta_1$) උෂ්ණත්වයේ පවතින ජලය m ස්කන්ධයක් භාජනයට වත් කරනු ලබන අතර, පසුව පියන ඉක්මනින් වසා දමනු ලැබේ. ජලයෙන් x භාගයක් (ස්කන්ධයට අනුව) ජල වාෂ්ප බවට පරිවර්තනය වන බව සිසුවෙක් උපකල්පනය කර එය සොයා ගැනීමට ගණනය කිරීමක් කළේය. ශිෂ්‍යයා $x > 1$ බව සොයා ගත්තේ නම්, පහත සඳහන් කුමක් සත්‍ය වන්නේ ද? අවට පරිසරයට තාප හානියක් සිදු නොවූ බව උපකල්පනය කරන්න.

(1) සියලුම ජලය, වාෂ්ප බවට පරිවර්තනය වී ඇති අතර පද්ධතියේ අවසාන උෂ්ණත්වය 100 °C ට සමාන වේ.
(2) සියලුම ජලය, වාෂ්ප බවට පරිවර්තනය වී ඇති අතර පද්ධතියේ අවසාන උෂ්ණත්වය 100 °C ට වඩා වැඩිය.
(3) සියලුම ජලය, වාෂ්ප බවට පරිවර්තනය වී ඇති අතර පද්ධතියේ අවසාන උෂ්ණත්වය 100 °C ට වඩා අඩුය.
(4) ජලයෙන් යම් කොටසක් වාෂ්ප බවට පරිවර්තනය වී ඇති අතර පද්ධතියේ අවසාන උෂ්ණත්වය 100 °C ට වඩා අඩුය.
(5) ජලයෙන් යම් කොටසක් වාෂ්ප බවට පරිවර්තනය වී ඇති අතර පද්ධතියේ අවසාන උෂ්ණත්වය 100 °C ට සමාන වේ.

49. දී ඇති පරිපථය සලකා බලන්න. මෙහි $R_2 > R_1 >> R_3$ වේ. පහත අසමානතා අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?



(1) $I_3 > 2I_1$ (2) $I_3 < 2I_2$

(3) $I_3 > 2I_2\frac{R_2}{R_1}$ (4) $I_3 > \frac{R_3(I_1+I_2)}{R_3+R_1}$

(5) $I_3 > \frac{R_2}{R_1}(I_1+I_2)$

50. තීව්‍රතාව E වන ඒකාකාර විද්‍යුත් ක්ෂේත්‍රයක් $+y$ දිශාවට ක්‍රියා කරන අතර රූපයේ දැක්වෙන පරිදි ස්‍රාව ඝනත්වය B වන ඒකාකාර චුම්බක ක්ෂේත්‍රයක් කඩදාසියේ තලයෙන් පිටතට යොමුවී ඇත. ස්කන්ධය m සහ ආරෝපණය $+q$ වන අංශුවක් O ලක්ෂ්‍යයේ සිට නිශ්චලතාවයෙන් මුදා හරිනු ලැබේ. තිරසේ සිට මනිනු ලබන y සිරස් උසකදී ආරෝපිත අංශුවේ වේගය කුමක් ද? (ගුරුත්වාකර්ෂණ බල නොසලකා හරින්න)



(1) $\sqrt{\frac{qEy}{2m}}$ (2) $\sqrt{\frac{qEy}{m}}$ (3) $\sqrt{\frac{2qEy}{m}}$

(4) $\sqrt{\frac{q(E+B)y}{m}}$ (5) $\sqrt{\frac{2q(E+B)y}{m}}$

* * *

108431

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

භෞතික විද්‍යාව II
பௌதிகவியல் II
Physics II

01 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ....

වැදගත් :

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු **16** කින් යුක්ත වේ.
- මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යන කොටස් **දෙකකින්** යුක්ත වේ. **කොටස් දෙකටම** නියමිත කාලය **පැය තුනකි.**
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු **නොලැබේ.**

A කොටස - ව්‍යුහගත රචනා
(පිටු 2 - 8)

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න. ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

B කොටස - රචනා
(පිටු 9 - 16)

මෙම කොටස ප්‍රශ්න **හයකින්** සමන්විත වන අතර ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතුය. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න.

- සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A** සහ **B** කොටස් **එක් පිළිතුරු පත්‍රයක් වන සේ, A කොටස B කොටසට උඩින්** තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයේ **B කොටස පමණක්** විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

II පත්‍රය සඳහා

කොටස	ප්‍රශ්න අංක	ලැබූ ලකුණු
A	1	
	2	
	3	
	4	
B	5	
	6	
	7	
	8	
	9(A)	
	9(B)	
	10(A)	
	10(B)	
එකතුව	ඉලක්කමෙන්	
	අකුරෙන්	

සංකේත අංක

උත්තර පත්‍ර පරීක්ෂක 1	
උත්තර පත්‍ර පරීක්ෂක 2	
ලකුණු පරීක්ෂා කළේ	
අධීක්ෂණය කළේ	

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki

මෙම තීරයේ කිසිවක් නොලියන්න

A කොටස – ව්‍යුහගත රචනා

ප්‍රශ්න **හතරටම** පිළිතුරු **මෙම පත්‍රයේම** සපයන්න.

$(g = 10 \text{ m s}^{-2})$

1. ද්‍රවයක ඝනත්වය සොයා ගැනීම සඳහා පාසල් විද්‍යාගාරයක භාවිත කරන පරීක්ෂණාත්මක සැකසුමක් රූපයේ පෙන්වා ඇත.



(*a*) රූපයේ පෙන්වා ඇති උපකරණයේ නම කුමක් ද?

....

(*b*) (i) *M* ලෙස සලකුණු කර ඇති අයිතම නම් කරන්න.

....

(ii) ඒවා තිබීමේ අරමුණ කුමක් ද?

....

....

....

(iii) පාඨාංක කට්ටලයක් ගැනීමට පෙර මෙම අයිතම සීරුමාරු කළ යුතුය. මෙම සීරුමාරුව කුමක් ද?

....

....

(*c*) මුඛ චූෂණ ක්‍රමයට සාපේක්ෂව සිරිංජයක් භාවිත කිරීමෙන් ද්‍රව කඳන් ඇද ගැනීමේ වාසි **දෙකක්** දෙන්න.

(i) පරීක්ෂණාත්මක වාසිය : ....

....

(ii) සෞඛ්‍ය සහ ආරක්ෂාව ආශ්‍රිත වාසිය : ....

....

(*d*) ඉහත පෙන්වා ඇති උපකරණයේ වීදුරු නළ දෙක පරිමාණ සමග සිරස්ව තිබිය යුතුය. මෙයට හේතුව කුමක් ද?

....

....

(*e*) (i) ජලයේ සහ ද්‍රවයේ ඝනත්ව පිළිවෙළින් d_w සහ d_l වේ. එක් එක් *M* හි දිග *x* වන අතර නළ තුළ වායු පීඩනය *P* වේ. අදාළ *M* හි ඉහළ කෙළවරවල සිට මනින ලද ජල කඳේ සහ ද්‍රව කඳේ උස පිළිවෙළින් h_w සහ h_l මගින් නිරූපණය කරන්නේ නම්, P, h_w, h_l, d_w, d_l සහ x සම්බන්ධ කරන සමීකරණය ලියා දක්වන්න.

....

....

(ii) ස්වායත්ත විචල්‍යය h_w ලෙස තබා ගනිමින් සුදුසු සරල රේඛා ප්‍රස්තාරයක් ඇඳීමෙන් d_l නිර්ණය කිරීම සඳහා ඉහත සමීකරණය නැවත සකසන්න.

PAST PAPERS WIKI

....

....

....

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(iii) එනයින්, ප්‍රස්තාරයේ අනුක්‍රමණය සහ අන්තඃඛණ්ඩය සඳහා ප්‍රකාශන ලියා දක්වන්න.

අනුක්‍රමණය : ....

අන්තඃඛණ්ඩය : ....

(iv) අඳින ලද සරල රේඛාවේ අනුක්‍රමණය 0·80 නම්, d_l නිර්ණය කරන්න. ($d_w = 1000\,\mathrm{kg\,m^{-3}}$)

....

....

(v) d_l නිර්ණය කිරීම සඳහා අනුක්‍රමණයට වඩා අන්තඃඛණ්ඩය භාවිත කිරීම නුසුදුසු වන්නේ ඇයි?

....

(*f*) (i) ඔබට *A*, *B* සහ *C* වීදුරු නළ තුනක් සපයා ඇත. *A*, *B* සහ *C* නළවල අභ්‍යන්තර විෂ්කම්භ පිළිවෙළින් 15 mm, 6 mm සහ 0·5 mm වේ. ඉහත රූපයේ දැක්වෙන උපකරණය සෑදීමට ඔබ තෝරා ගන්නේ කුමන වීදුරු නළයද?

නළය :..

(ii) ඔබ අනෙක් **නළ දෙක තෝරා නොගැනීමට** හේතු දක්වන්න.

නළය...... හේතුව: ....

....

නළය...... හේතුව: ....

....

2. පාසල් විද්‍යාගාරයේදී සිසිලන ක්‍රමය භාවිත කරමින් නොදන්නා ද්‍රවයක (L) විශිෂ්ට තාප ධාරිතාව නිර්ණය කිරීම සඳහා පරීක්ෂණයක් සිදු කරනු ලැබේ. පළමුව තඹ කැලරිමීටරයක්, 70 °C දක්වා රත් කරන ලද දන්නා ජල පරිමාවකින් කැලරිමීටරයේ ඉහළ සිට 1 cm ක් දක්වා පුරවා, 25 °C නියත කාමර උෂ්ණත්වයක පවතින පරිසරයක සිසිල් වීමට ඉඩ හරිනු ලැබේ. ඉන්පසු, එකම පාරිසරික තත්ත්වයන් යටතේ L ද්‍රවයේ සමාන පරිමාවක් භාවිත කරමින් පරීක්ෂණය නැවතත් සිදු කරන ලදී.
පරීක්ෂණ දෙකෙන් ලබාගත් සිසිලන වක්‍ර (කාලය t ට එදිරිව උෂ්ණත්වය θ) පහත දැක්වෙන පරිදි එකම ජාලය මත අඳින ලදී.



මෙම තීරයේ කිසිවක් නොලියන්න

(*a*) නිව්ටන්ගේ සිසිලන නියමය සඳහා සමීකරණයක් ලියා භාවිත කරන සියලු සංකේත හඳුන්වා දෙන්න.

....

....

....

....

(*b*) (i) පරීක්ෂණයේ අවස්ථා දෙකේදීම එකම කැලරිමීටරය භාවිත කිරීම අත්‍යවශ්‍ය වන්නේ ඇයි?

....

....

(ii) ජලයේ සහ ද්‍රවයේ පරිමාවන් සමාන විය යුත්තේ ඇයි?

....

....

(*c*) මෙම පරීක්ෂණයේදී, කැලරිමීටරය වටා නියත වායු ප්‍රවාහයක් සැපයීමට විදුලි පංකාවක් භාවිත කළ හැකිය. මේ සඳහා හේතුවක් දෙන්න.

....

....

(*d*) උෂ්ණත්ව මිනුම් ගන්නාවිට නිරන්තරයෙන් මන්ථනය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙයට හේතුව කුමක් ද?

....

(*e*) භාවිත කරන ජල ස්කන්ධය $m_W = 0{\cdot}25\,\text{kg}$ වන අතර ද්‍රවයෙහි ස්කන්ධය $m_L = 0{\cdot}20\,\text{kg}$ වේ. මන්ථය සමග තඹ කැලරිමීටරයේ ස්කන්ධය $0{\cdot}05\,\text{kg}$ වන අතර තඹ සහ ජලයේ විශිෂ්ට තාප ධාරිතා පිළිවෙළින් $400\,\text{J}\,\text{kg}^{-1}\,\text{K}^{-1}$ සහ $4200\,\text{J}\,\text{kg}^{-1}\,\text{K}^{-1}$ වේ.

(i) $55\,^\circ\text{C}$ උෂ්ණත්වයේදී, ජලයේ සිසිලන ශීඝ්‍රතාව $0{\cdot}60\,^\circ\text{C}\,\text{min}^{-1}$ ලෙස මනිනු ලැබේ. මෙම උෂ්ණත්වයේදී පද්ධතියෙන් පරිසරයට තාපය හානි වීමේ ශීඝ්‍රතාවය $\dfrac{dQ}{dt}$ ගණනය කරන්න.

....

....

....

....

(ii) මෙම උෂ්ණත්වයේදී L ද්‍රවයේ සිසිලන ශීඝ්‍රතාව $1{\cdot}50\,^\circ\text{C}\,\text{min}^{-1}$ වේ. ද්‍රවයෙහි විශිෂ්ට තාප ධාරිතාව C_L ගණනය කරන්න.

....

....

....

....

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(*f*) 55 °C දී සිසිලන වක්‍රයකට ස්පර්ශකය නිර්මාණය කිරීම සඳහා ශිෂ්‍යයෙක් කුඩා තල දර්පණයක් භාවිත කළේය (දර්පණ ක්‍රමය). ඔහු අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටියේ පියවර ලියා දක්වන්න.

(i) දර්පණය තැබීමට අදාළව:

....

....

....

(ii) සුදුසු රේඛා ඇඳීමට අදාළව:

(1) ....

....

(2) ....

....

(*g*) 70 °C ඉක්මවන ආරම්භක උෂ්ණත්වයකින් පරීක්ෂණය ආරම්භ කිරීම යෝග්‍ය නොවේ. මෙයට හේතුවක් දෙන්න.

....

3. රූපය (1) (A) හි එක් කෙළවරක් වසා ඇති අනුනාද නළයක් සහ සරසුලක් භාවිතයෙන් වාතයේ ධ්වනි ප්‍රවේගය සොයා ගැනීම සඳහා භාවිත කළ හැකි විකල්ප පරීක්ෂණාත්මක ඇටවුමක් පෙන්වයි. මෙම ඇටවුමේ මූලධර්මය පාසල් විද්‍යාගාරයේ සාමාන්‍යයෙන් භාවිත කරන ඇටවුමේ මූලධර්මයට සමාන වේ. සවි කර ඇති කරාමය භාවිතයෙන් නළයේ ජල මට්ටම අඩු කළ හැකි අතර නළයට ජලය එකතු කිරීමෙන් එය ඉහළ නැංවිය හැකිය.



(1) රූපය

(*a*) (i) මෙම පරීක්ෂණය සිදු කිරීමට සරසුලට අමතරව ඔබට අවශ්‍ය අනෙක් අත්‍යවශ්‍ය අයිතමය නම් කරන්න.

....

(ii) (1) (A) රූපයේ සරසුල තැබීමට සුදුසු ස්ථානය සහ එහි දිශානතිය අඳින්න.

(*b*) නළයේ ආන්ත ශෝධනය සලකමින් පළමු කම්පන විධිය (මූලිකය) සහ දෙවන කම්පන විධිය සඳහා වන ස්ථාවර තරංග රටා අදාළ රූපවල අඳින්න.

(*c*) නළයේ කුමන ස්ථානයේ වාතයේ පීඩන විචලනය උපරිම වේ ද? නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.
සංවෘත කෙළවරේ / විවෘත කෙළවරේ

(*d*) (i) වාතයේ ධ්වනි ප්‍රවේගය v සඳහා සමීකරණයක් සරසුලේ සංඛ්‍යාතය f සහ ඉහත (1) රූපයේ පෙන්වා ඇති අනුනාද දිගවල වෙනස d ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

....

....

....

....

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(ii) $f = 512\,\text{Hz}$ සහ $d = 34\,\text{cm}$ නම් වාතයේ ධ්වනි ප්‍රවේගය v ගණනය කරන්න.

....

....

(iii) නළයේ අභ්‍යන්තර විෂ්කම්භය වැඩි කළ විට ආන්ත ශෝධනයට කුමක් සිදුවේ ද? නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

වැඩි වේ / අඩු වේ / වෙනස් නොවේ.

(*e*) ඔබට **සරසුල් කට්ටලයක්** සහ V පරිමාවක් සහිත වායු කුහරයක් අඩංගු බෝතලයක් [(2) රූපය බලන්න] ලබා දී ඇති අතර, එය හරස්කඩ වර්ගඵලය A සහ ආන්ත ශෝධනයත් සමග දිග L වූ පටු නළයක් හරහා වායුගෝලයට විවෘත කර ඇත. **ජලය එකතු කිරීමෙන්** V පරිමාව අඩු කරනු ලැබේ. නළයේ ඇති වාතය කම්පනය වන සරසුලෙන් කැලඹූ විට, පද්ධතිය පහත සමීකරණය මගින් ලබා දෙන ලාක්ෂණික f සංඛ්‍යාතයෙන් යුත් අනුනාදයක් ඇති කරයි. මෙහි v යනු වාතයේ ධ්වනි ප්‍රවේගයයි.

$$f = \frac{v}{2\pi}\sqrt{\frac{A}{VL}}$$



(2) රූපය

(i) විශාල L අගයක් සඳහා f ට කුමක් සිදුවේද? නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.
වැඩි වේ / අඩු වේ / වෙනස් නොවේ.

(ii) පරීක්ෂණය ආරම්භ කිරීමට ඔබ මුලින්ම තෝරා ගන්නේ කුමන සරසුල ද? නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

වැඩිම සංඛ්‍යාත සරසුල / අඩුම සංඛ්‍යාත සරසුල

(iii) ඉහත (*e*) හි සමීකරණය නැවත සකස් කර සරල රේඛා ප්‍රස්තාරයක් ඇඳීමට V උක්ත කරන්න.

....

....

....

(iv) ඉහත (*e*) (iii) හි සමීකරණයට අනුරූපව අක්ෂ නම් කරමින් පහත රූප සටහනේ අපේක්ෂිත ප්‍රස්තාරය අඳින්න.



(v) එනයින්, වාතයේ ධ්වනි ප්‍රවේගය v සඳහා සමීකරණයක් ප්‍රස්තාරයේ අනුක්‍රමණය m, A සහ L ඇසුරෙන් ලියා දක්වන්න.

....

....

PAST PAPERS WIKI

මෙම තීරයේ කිසිවක් නොලියන්න

4. විදුලි කෝෂයක වි. ගා. බ. E සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය r නිර්ණය කිරීමට ශිෂ්‍යයෙකුට නියමව ඇත. ඔහුට විදුලි කෝෂයක්, ධාරා නියාමකයක් $(0 - 100\,\Omega)$, ප්‍රතිරෝධය R වූ ප්‍රතිරෝධකයක් සහ සම්බන්ධක කම්බි ලබා දී ඇත.

(a) විදුලි කෝෂයේ E සහ r නිර්ණය කිරීමට භාවිත කරන පරිපථයක් (1) රූපයේ පෙන්වයි.

පරිපථයේ නම් කර ඇති එක් එක් කොටුව සඳහා පහත දක්වා ඇති යුගලවලින් වඩාත් සුදුසු උපකරණය තෝරන්න. නිවැරදි පිළිතුරු යටින් ඉරි අඳින්න.

A : ගැල්වනෝමීටරය / සංඛ්‍යාංක වෝල්ට්මීටරය

B : මිලිඇමීටරය / වෝල්ට්මීටරය

C : පේනු යතුර / ටකන යතුර



(1) රූපය

(b) (i) ධාරා නියාමකයට අමතරව පරිපථයට ස්ථාවර ප්‍රතිරෝධකයක් ඇතුළත් කර ඇත්තේ ඇයි?

....

(ii) R සඳහා $10\,\Omega$ සහ $1000\,\Omega$ අගයන් සහිත ප්‍රතිරෝධක දෙකක් තිබේ. භාවිත කිරීමට වඩාත් සුදුසු ප්‍රතිරෝධය කුමක් ද? ධාරා කියවීම් පරාසය මත පදනම්ව හේතුවක් දෙන්න.

ප්‍රතිරෝධය :..

හේතුව :..

....

(c) (i) රූපය (2) හි පෙන්වා ඇති ධාරා නියාමකයේ පරිපථයට සම්බන්ධ කළ යුතු අග්‍ර හඳුනා ගන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

X සහ Y / X සහ Z



(2) රූපය

(ii) පළමු කියවීම සඳහා යතුර වැසීමට පෙර, පරිපථයේ ආරක්ෂාව සඳහා ඉහත (c) (i) හි පෙන්වා ඇති ධාරා නියාමකයේ සර්පණ ස්පර්ශකය (slider) පහත සඳහන් ස්ථානවලින් කොතැනක පිහිටුවිය යුතුද? නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

සර්පණ ස්පර්ශකය X ට ආසන්නව / සර්පණ ස්පර්ශකය Y ට ආසන්නව

(d) ඉහත (a) හි සඳහන් සුදුසු යතුර තෝරා ගැනීමට හේතුව කුමක් ද?

....

(e) (i) විදුලි කෝෂය හරහා ධාරාව I වන විට, විදුලි කෝෂයේ අග්‍ර හරහා විභව අන්තරය V වේ. විදුලි කෝෂයේ වි. ගා. බ. E සඳහා සමීකරණයක් V, I, සහ විදුලි කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය r ඇසුරෙන් ලියා දක්වන්න.

....

(ii) සරල රේඛා ප්‍රස්තාරයක් ඇඳීම සඳහා ඉහත (e) (i) හි සමීකරණය නැවත සකසන්න.

....

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(*f*) පරීක්ෂණයේදී පහත ප්‍රස්තාරය ලබා ගන්නා ලදී.



(i) ඉතාම සුදුසු ලක්ෂ්‍ය දෙක භාවිත කොට ප්‍රස්තාරයේ අනුක්‍රමණය ගණනය කරන්න.

....

....

....

(ii) එනයින් වියළි කෝෂයේ අභ්‍යන්තර ප්‍රතිරෝධය r නිර්ණය කරන්න.

....

(iii) සරල රේඛාව දික් කිරීමෙන් E හි අගය ආසන්න දශම ස්ථාන දෙකකට නිර්ණය කරන්න.

....

(iv) ඉහත වියළි කෝෂය අඩු E අගයක් සහ වැඩි r අගයක් සහිත වෙනත් වියළි කෝෂයකින් ප්‍රතිස්ථාපනය කරන ලදී. ඉහත දී ඇති ජාලය මත ඔබ බලාපොරොත්තු වන සරල රේඛාවේ දළ සටහනක් අඳින්න.

(*g*) නොදන්නා අඩු ප්‍රතිරෝධයක් සහිත වෝල්ට්මීටරයක් පරිපථයේ භාවිත කළේ නම්, E සහ r හි ඉහත නිර්ණය කළ අගයන්ට එය බලපාන්නේ කෙසේ ද?

(i) E හි අගය : වැඩි අගයක් ලැබේ / අඩු අගයක් ලැබේ / බලපෑමක් ඇති නොවේ.
නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(ii) r හි අගය : වැඩි අගයක් ලැබේ / අඩු අගයක් ලැබේ / බලපෑමක් ඇති නොවේ.
නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

* *

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

භෞතික විද්‍යාව II பௌதிகவியல் II Physics II	B කොටස — රචනා	01 S II

ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
$(g = 10\,\text{m s}^{-2})$

5. පහත ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජල විදුලි බලාගාරයක්, ඉහළ උන්නතාංශවල පිහිටා ඇති ජලාශවල රැස් කරන ලද ජලයේ ගුරුත්වාකර්ෂණ විභව ශක්තිය විදුලිය ජනනය කිරීම සඳහා භාවිත කරයි. විදුලිය අවශ්‍ය වූ විට, පාලිත දොරටු විවෘත කොට එමගින් මෙම රැස් කර ඇති ජලය ඝන වානේ නළයක් (කොටු දොර) හරහා (1) රූපයෙහි පෙන්වා ඇති පරිදි පහළට වැටීමට සලස්වයි. ගුරුත්වාකර්ෂණය නිසා පහළට වැටෙන ජලය එහි ගමනේ අවසානයට ළඟා වන විට දැවැන්ත ජල පීඩනයක් ඇති කරයි.



(1) රූපය

වානේ නළයේ පහළ කෙළවරේදී, මෙම විශාල ජල පරිමාව නැසින්නක් (nozzle) හරහා ගලා යාමට සලස්වනු ලැබේ. නැසින්න ටර්බයිනයක් භ්‍රමණය කිරීමට අවශ්‍ය යාන්ත්‍රික බලය සපයන ප්‍රවේගය ඉතා වැඩි ජල පහරක් නිර්මාණය කරයි. මෙම ටර්බයිනය, 1880දී එය සොයා ගත් එල්. ඒ. පෙල්ටන්ගේ (L. A. Pelton) නමින් පෙල්ටන් ටර්බයිනය ලෙස හැඳින්වේ. මෙය වෘත්තාකාර තැටියක ආකාරයේ රෝදයකින් සමන්විත වන අතර එහි පරිධියේ, පෙල්ටන් බඳුන් (buckets) ගණනාවක් සවි කර ඇත්තේ ඒවා අතර පරතරය සමාන වන පරිදි ය. සවි කර ඇති එක් එක් බඳුන අර්ධ-ඉලිප්සාභ හැඩයකින් යුත් කෝප්ප දෙකකින් සමන්විත වේ (2 රූපය බලන්න).

බඳුනකට ජලය වදින විට රෝදය අධික වේගයෙන් භ්‍රමණය වීමට පෙළඹෙන අතර, ජලයේ චාලක ශක්තිය යාන්ත්‍රික භ්‍රමණ ශක්තිය බවට පරිවර්තනය කරයි. භ්‍රමණ රෝදය විශාල විදුලි ජනක යන්ත්‍රයක් භ්‍රමණය කරන මධ්‍යම ඊෂාවකට (central shaft) සම්බන්ධ වේ. ජනක යන්ත්‍රයට ස්ථාවර තඹ දඟර වළල්ලක් තුළ භ්‍රමණය වන ප්‍රබල චුම්බක ඇත. මෙම ක්‍රියාවලිය විද්‍යුත් චුම්බක ප්‍රේරණය හරහා විද්‍යුත් ධාරාවක් ජනනය කර ජාතික සම්ප්‍රේෂණ ජාලය හරහා යවනු ලැබේ. පොසිල ඉන්ධන බලාගාර මෙන් නොව, ජල විදුලි බලාගාර සෘජු හරිතාගාර වායු, කාබන් මොනොක්සයිඩ් සහ සල්ෆර් ඩයොක්සයිඩ් වැනි අනෙකුත් විෂ සහිත වායු, අංශුමය ද්‍රව්‍ය සහ අළු ජනනය නොකරයි. (රූප පරිමාණයට ඇඳ නොමැත.)



(2) රූපය

(*a*) ජල විදුලි බලාගාරයක ඉහළ උන්නතාංශයක පිහිටි ජලාශවල ජලය ගබඩා කිරීම අත්‍යවශ්‍ය වන්නේ ඇයි?

(*b*) භ්‍රමණය වන රෝදයේ පරිධිය මත සවි කරන ලද බඳුනක ඇති කෝප්පවල හැඩය කුමක් ද?

(*c*) ජල විදුලි බලාගාරයක ශක්ති පරිණාමනයට සම්බන්ධ වන ශක්ති වර්ග **හතර** අනුපිළිවෙළින් සඳහන් කරන්න.

(*d*) ස්ථාවර තඹ දඟර තුළ භ්‍රමණය වන චුම්බකවලින් විදුලිය ජනනය කිරීමට බලපාන මූලධර්මය කුමක් ද?

(*e*) පොසිල ඉන්ධන දහනය කිරීමට වඩා ජල විදුලියෙන් විදුලිය ජනනය කිරීම ඉතා සුදුසු වන්නේ ඇයි?

(*f*) (i) ජල විදුලි බලාගාරයක ජලාශයේ ජල මට්ටම (1) රූපයේ දැක්වෙන AB තිරස් මට්ටමට වඩා 540·0 m සිරස් උසකින් පිහිටා ඇත. ජලාශය P වායුගෝලීය පීඩනයට විවෘතව ඇති අතර නැසින්නට ඇතුළු වීමට පෙර ජල පීඩනය $54{\cdot}875P$ වේ. ජලාශයේ මතුපිට වර්ගඵලය විශාල බව, ජල ප්‍රවාහය අනවරත බව සහ ජලය දුස්ස්‍රාවී නොවන බව උපකල්පනය කරමින් නැසින්නට ඇතුළු වීමට පෙර ජලයේ වේගය v' ගණනය කරන්න. වායුගෝලීය පීඩනය $P = 10^5\,\text{Pa}$, ජලයේ ඝනත්වය $= 10^3\,\text{kg m}^{-3}$.

(ii) $\dfrac{\text{කොටු දොරේ අභ්‍යන්තර හරස්කඩ වර්ගඵලය}}{\text{නැසින්නේ බිහිදොරෙහි අභ්‍යන්තර හරස්කඩ වර්ගඵලය}}$ යන අනුපාතය $= 20$ නම්, B හිදී නැසින්නෙන් පිටවන තිරස් ජල පහරේ ප්‍රවේගය v නිර්ණය කරන්න. ජලය අසම්පීඩ්‍ය යැයි උපකල්පනය කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

(iii) නැසින්නෙන් පිටවන ජලයේ ස්කන්ධ ප්‍රවාහ ශීඝ්‍රතාව m ගණනය කරන්න. නැසින්නේ බිහිදොරෙහි අභ්‍යන්තර විෂ්කම්භය 20 cm වේ. $\pi = 3$ ලෙස ගන්න.

(*g*) (i) ඉහත (*f*) (ii) හි ගණනය කරන ලද v ප්‍රවේගය සහිත ජල පහර එක බඳුනක ගැටෙන විට, එය u තිරස් ප්‍රවේගයක් ලබා ගනී. බඳුනට සාපේක්ෂව පැමිණෙන ජල පහරේ ප්‍රවේගය v_r සඳහා සමීකරණයක් v සහ u ඇසුරෙන් ලියා දක්වන්න. $(v > u)$

(ii) රූපය (2) හි දැක්වෙන පරිදි ජල පහර බඳුනේ මැදට වදින විට, එය සමාන ප්‍රවාහ දෙකකට බෙදේ. ඉහළ කෝප්පයෙන් ජලය පිටවන විට, ඉහළ කෝප්පයට සාපේක්ෂව නික්මයන ජල ප්‍රවාහයේ ප්‍රවේගයේ තිරස් සංරචකය v_e සඳහා සමීකරණයක් v_r සහ α ඇසුරෙන් ලියා දක්වන්න. ප්‍රවාහය පුරාම ජල පහරේ සාපේක්ෂ වේගය නොවෙනස්ව පවතින බව උපකල්පනය කරන්න.

(iii) ඉහළ කෝප්පය මත වදින ජලයේ ස්කන්ධ ප්‍රවාහ ශීඝ්‍රතාව $\frac{m}{2}$ [ඉහත (*f*) (iii) හි ගණනය කරන ලද m] වේ. ස්ථාවර තත්ත්වය ලබා ගත් පසු, ජල ප්‍රවාහයේ ගම්‍යතාව වෙනස් වීමේ ශීඝ්‍රතාව හේතුවෙන් ඉහළ කෝප්පය මත ක්‍රියා කරන තිරස් බලය F නම්, $F = \frac{m}{2} v_r (1 + \cos\alpha)$ මගින් ලබා දෙන බව පෙන්වන්න.

(iv) බඳුන මත ක්‍රියා කරන මුළු තිරස් බලය F', F ඇසුරෙන් ලියා දක්වන්න.

(*h*) (i) බඳුන් සමග රෝදයේ මධ්‍යන්‍ය විෂ්කම්භය 1·5 m සහ එය විනාඩියට වට 720ක වේගයෙන් භ්‍රමණය වන්නේ නම්, ඉහත (*g*) (i) හි සඳහන් u නිර්ණය කරන්න. $\pi = 3$ ලෙස ගන්න.

(ii) F'හි අගය ගණනය කරන්න. $\alpha = 20^\circ$ සහ $\cos 20^\circ = 0{\cdot}95$ ලෙස ගන්න.

(iii) රෝදය වෙත ලබා දෙන ප්‍රදාන ක්ෂමතාව ගණනය කරන්න. ඔබේ පිළිතුර ආසන්නතම MW අගයට ලබා දෙන්න.

6. (*a*) තිරස් අතුරුමුහුණතකින් වෙන් වූ 1 මාධ්‍යය සහ 2 මාධ්‍යය යන මාධ්‍ය දෙකක් සලකන්න. තරංගයක් 1 මාධ්‍යය හරහා ගමන් කර 2 මාධ්‍යය වෙත වර්තනය වේ. මාධ්‍යය 1හි පතන කෝණය i වන අතර මාධ්‍යය 2හි වර්තන කෝණය r වේ. 1 සහ 2 මාධ්‍යවලදී එම තරංගයේ ප්‍රවේග පිළිවෙළින් V_1 සහ V_2 වේ. ඕනෑම ආකාරයක තරංග වර්තනයක් සඳහා ස්නෙල් නියම යෙදිය හැකිය.

(i) මාධ්‍යය 1ට සාපේක්ෂව මාධ්‍යය 2හි වර්තනාංකය $({}_1n_2)$ සඳහා සමීකරණයක් i සහ r ඇසුරෙන් ලියා දක්වන්න.

(ii) වර්තනාංකය ${}_1n_2$ සඳහා සමීකරණයක් V_1 සහ V_2 ඇසුරෙන් ලියා දක්වන්න.

(*b*) පෘථිවියේ, කබොල එකිනෙකට සමාන්තර අවසාදිත (sedimentary) ස්තරවලින් සමන්විත ආකෘතියක් ලෙස සැලකිය හැකි අතර, ඒ සෑම එකකටම ආවේණික V තරංග ප්‍රවේගයක් ඇත. පෘථිවි පෘෂ්ඨය අසල Pහි ජනනය කරන ලද අඩු සංඛ්‍යාත ධ්වනි තරංග ස්තර මායිම්වලදී පරාවර්තනයට සහ වර්තනයට භාජනය වී පෘෂ්ඨය මත තබා ඇති ග්‍රාහක මගින් අනාවරණය කරනු ලැබේ. මෙම තරංගවල පැමිණීමේ කාලයන් විශ්ලේෂණය කිරීම මගින්, තරංග ප්‍රවේග සහ භූගත ස්තරවල ව්‍යුහය නිර්ණය කළ හැකිය. පෘථිවිය හරහා ප්‍රචාරණය වන තරංග ස්තර මායිම්වලදී පරාවර්තන සහ වර්තන නියම (ස්නෙල් නියම) පිළිපදී. තවද, එක් එක් ස්තරය තුළ තරංග ප්‍රවේගය නියත යැයි සහ දිශාවෙන් ස්වායත්ත යැයි උපකල්පනය කෙරේ.



එවැනි ගවේෂණයකදී, ජනනය වන තරංග ග්‍රාහකය වෙත පැමිණිය හැකි කිරණ මාර්ග තුනක් රූප සටහනෙහි දක්වා ඇත. පළමු තරංගය (සෘජු තරංගය) V_1 ප්‍රවේගයක් සහිතව 1 ස්තරය හරහා P ප්‍රභවයේ සිට S ග්‍රාහකය දක්වා සෘජුවම ගමන් කරයි. දෙවන තරංගය (පරාවර්තිත තරංගය) 1 සහ 2 ස්තර අතර මායිමේ T ලක්ෂ්‍යයේදී පරාවර්තනය වීමෙන් පසු P ප්‍රභවයේ සිට S ග්‍රාහකය දක්වා V_1 ප්‍රවේගයෙන් ගමන් කරයි. තෙවන තරංගය (ශීර්ෂ තරංගය) P ප්‍රභවයේ සිට 1 ස්තරය හරහා V_1 ප්‍රවේගයෙන් ගමන් කොට Q ලක්ෂ්‍යයේදී පතන කෝණය, C අවධි කෝණයට සමානව අවධි වර්තනයට භාජනය වී පසුව V_2 ප්‍රවේගයෙන් 2 ස්තරයේ අතුරුමුහුණත දිගේ ප්‍රචාරණය වේ. ඉන්පසුව එය එම C අවධි කෝණයෙන්ම R ලක්ෂ්‍යයේදී 1 ස්තරයට අවධිව වර්තනය වන අතර අවසානයේ රූප සටහනේ දැක්වෙන පරිදි S ග්‍රාහකය වෙත පැමිණේ.

(i) P ලක්ෂ්‍යයේදී ජනනය වී 1 ස්තරය හරහා සරල රේඛීයව ගමන් කරන තරංගය, 0·25 s කට පසු S ග්‍රාහකය වෙත ළඟා වේ. රූපයේ දැක්වෙන පරිදි, ග්‍රාහකය ප්‍රභවයේ සිට $x = 1000$ m දුරකින් පිහිටා ඇත. 1 ස්තරයේ තරංග ප්‍රවේගය V_1 ගණනය කරන්න.

(ii) ඉහත තරංගවල සංඛ්‍යාතය 50 Hz නම්, 1 ස්තරයේ ගමන් කරන තරංගවල තරංග ආයාමය λ නිර්ණය කරන්න.

[එකොළොස්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(*c*) P ප්‍රභවයේ සිට ගමන් කරන තරංගය, 1 සහ 2 ස්තර අතර මායිමේ පිහිටි T ලක්ෂ්‍යයේදී පරාවර්තනය වී, $0{\cdot}40$ s කට පසු S ග්‍රාහකය වෙත පැමිණේ.

(i) ඉහත (*b*) (i)හි ගණනය කළ තරංගයේ ප්‍රවේගය V_1 සහ පරාවර්තිත තරංගය පැමිණීමට ගත වූ කාලය භාවිතයෙන්, පරාවර්තිත තරංගය ගමන් කළ PTS මුළු දුර ගණනය කරන්න.

(ii) එනයින් පරාවර්තනය වූ තරංග මාර්ගයේ ජ්‍යාමිතිය භාවිතයෙන් 1 ස්තරයේ ඝනකම h ගණනය කරන්න. ($\sqrt{39} = 6{\cdot}25$ ලෙස ගන්න)

(*d*) රූපයේ දැක්වෙන $PQRS$ තරංග මාර්ගය සලකන්න.

(i) රූපයේ Q ලක්ෂ්‍යයේදී සිදුවන අවධි වර්තනය සඳහා වන අවශ්‍යතාවය භාවිතයෙන්, අවධි කෝණය C සඳහා සමීකරණයක් 1 ස්තරයේ තරංග ප්‍රවේගය V_1 සහ 2 ස්තරයේ තරංග ප්‍රවේගය V_2 ඇසුරෙන් ලියා දක්වන්න.

(ii) P ප්‍රභවයේ සිට S ග්‍රාහකය දක්වා $PQRS$ මාර්ගය ඔස්සේ ගමන් කරන අවධිව වර්තනය වූ තරංගයේ (ශීර්ෂ තරංගය) මුළු ගමන් කාලය T_H නම්, $T_H = \dfrac{x}{V_2} + \dfrac{2h}{V_1 \cos C}\left(1 - \dfrac{V_1^2}{V_2^2}\right)$ බව පෙන්වන්න. $\tan C = \dfrac{\sin C}{\cos C}$ ලෙස ගන්න. මෙහි x යනු ප්‍රභවය සහ ග්‍රාහකය අතර දුර වන අතර, h යනු 1 ස්තරයේ ඝනකම වේ. ඉඟිය : $T_H = \dfrac{PQ}{V_1} + \dfrac{QR}{V_2} + \dfrac{RS}{V_1}$

(iii) ප්‍රභවයේ සිට එකිනෙකට වෙනස් තිරස් දුර දෙකක තබා ඇති ග්‍රාහක දෙකක් ප්‍රභවයෙන් ජනනය වන අවධිව වර්තනය වූ තරංග අනාවරණය කරනු ලැබේ. $x_1 = 1000$ m තිරස් දුරකදී, ශීර්ෂ තරංගයේ පැමිණීමේ කාලය $t_1 = 0{\cdot}39$ s වේ. $x_2 = 1600$ m තිරස් දුරකදී, ශීර්ෂ තරංගයේ පැමිණීමේ කාලය $t_2 = 0{\cdot}51$ s වේ. ඉහත (*d*) (ii) සමීකරණයෙන් ලබාගත් ශීර්ෂ තරංගයේ ගමන් කාලය $T_H = \dfrac{x}{V_2} + A$, ලෙස ලිවිය හැක. මෙහි A යනු නියතයක් වන අතර x යනු ප්‍රභවයේ සිට ග්‍රාහකය දක්වා ඇති තිරස් දුර වේ. 2 ස්තරයේ තරංග ප්‍රවේගය V_2 නිර්ණය කරන්න.

(iv) ඉහත (*a*) (ii) හි ලබාගත් සමීකරණය භාවිත කොට ${}_1n_2$ නිර්ණය කරන්න.

7. (*a*) කාර්මික පරීක්ෂණාගාරයක් හයිඩ්‍රොලික් පද්ධතියක භාවිත කිරීමට පෙර ලිහිසි තරලයක් පරීක්ෂා කරයි. එහි දුස්ස්‍රාවිතා සංගුණකය මැනීමට (1) රූපයෙහි පෙන්වා ඇති විකරණය කරන ලද සමාන්තර තහඩු දුස්ස්‍රාවිතාමානයක් භාවිත කළ හැක.

දුස්ස්‍රාවිතාමානය විශාල සුමට ස්ථාවර තහඩුවකට ඉහළින් තබා ඇති පැත්තක දිග L වන සුමට හතරැස් ඉහළ තහඩුවකින් සමන්විත වේ. තහඩු කුඩා ඒකාකාර h පරතරයක් මගින් වෙන් කරනු ලබන අතර එය පරීක්ෂණ තරලයෙන් සම්පූර්ණයෙන්ම පිරී ඇත. ඉහළ තහඩුව ඝර්ෂණය රහිත කප්පියක් හරහා යන M ස්කන්ධයක් එල්ලා ඇති සැහැල්ලු අවිතන්‍ය තන්තුවකට සම්බන්ධ කර ඇත.

ඉහළ තහඩුව චලනය වන විට, තහඩුවේ A ලක්ෂ්‍යයේ විස්ථාපනය, විස්ථාපන සංවේදකයක් භාවිතයෙන් අඛණ්ඩව මනිනු ලැබේ. කෙටි කාලයකින් පසු, ඉහළ තහඩුව **නියත ප්‍රවේගයක්** ලබා ගනී. මෙම ස්ථාවර චලිතයේදී, A ලක්ෂ්‍යය t කාල පරතරයකදී s දුරක් චලනය වන බව නිරීක්ෂණය කෙරේ.



(1) රූපය

(i) ස්ථාවර චලිතය සලකා තරලයේ දුස්ස්‍රාවිතා සංගුණකය η සඳහා සමීකරණයක් M, L, s, t සහ h ඇසුරෙන් ලබා ගන්න.

(ii) පරීක්ෂණයේදී, $M = 0{\cdot}50$ kg ස්කන්ධයක් භාවිතයෙන් දුස්ස්‍රාවිතාමානය ක්‍රියාත්මක වේ. ස්ථාවර චලිතයේදී, ඉහළ තහඩුවේ A ලක්ෂ්‍යය $8{\cdot}0$ s කදී $0{\cdot}20$ m ක දුරක් ගමන් කරයි. $L = 0{\cdot}10$ m සහ $h = 0{\cdot}10$ mm. තරලයේ දුස්ස්‍රාවිතා සංගුණකය η ගණනය කරන්න.

(*b*) රූපය (2) හි දුස්ස්‍රාවිතා සංගුණකය මැනීම සඳහා කාර්මික පරීක්ෂණාගාරවල බහුලව භාවිත කරන භ්‍රමණය වන ඒකාක්ෂ සිලින්ඩර දුස්ස්‍රාවිතාමානයක දික් කැපුමක් පෙන්වයි. අභ්‍යන්තර සිලින්ඩරය ව්‍යාවර්ත දණ්ඩකින් අවලම්බනය කොට ඇති අතර පිටත සිලින්ඩරය භ්‍රමණය වේ. තරලය මගින් යොදන දුස්ස්‍රාවි බලය අභ්‍යන්තර සිලින්ඩරය මත ව්‍යාවර්තයක් ඇති කරන අතර එමගින් ව්‍යාවර්ත දණ්ඩ θ කෝණයකින් ඇඹරීමට හේතු වේ.

(i) දණ්ඩේ ව්‍යාවර්ත නියතය C නම්, දණ්ඩේ ප්‍රතිපාදන ව්‍යාවර්තය τ සඳහා සමීකරණයක් C සහ කෝණික උත්ක්‍රමය θ (රේඩියන) ඇසුරෙන් ලියා දක්වන්න.

(ii) අභ්‍යන්තර සිලින්ඩරය මත ක්‍රියා කරන දුස්ස්‍රාවි බලය $10{\cdot}0$ N වේ. අභ්‍යන්තර සිලින්ඩරයේ අරය $5{\cdot}0$ cm වන අතර ව්‍යාවර්ත දණ්ඩේ කෝණික උත්ක්‍රමය $0{\cdot}20$ rad නම්, දණ්ඩේ ව්‍යාවර්ත නියතය C ගණනය කරන්න.



(2) රූපය

(*c*) රූපය (3) හි දැක්වෙන පරිදි, එකම ද්‍රව්‍යයෙන් සාදන ලද ඉතා කුඩා ලෝහ ගෝලවල විෂ්කම්භයන්හි විචලනය අනාවරණය කර ගැනීම සඳහා දුස්ස්‍රාවී තරලයක් භාවිත කළ හැක. මෙහිදී තරලයෙන් පිරුණු සිරස් විනිවිද පෙනෙන නළයක් තුළ නිශ්චලතාවයේ සිට කුඩා වානේ ගෝලයක් මුදා හරිනු ලැබේ. ආන්ත ප්‍රවේගය අත්පත් කරගත් පසු, ගෝලය පහළට ගමන් කර නළයේ පතුලේ ඇති ස්විච්චියක් සක්‍රිය කරයි. විවිධ විෂ්කම්භයන් සහිත ගෝල සඳහා ස්විච්චිය සක්‍රිය කිරීමට ගතවන කාලය වෙනස් වේ.



(3) රූපය

(i) වානේ ගෝලයේ ආන්ත ප්‍රවේගය v_t සඳහා සමීකරණයක් එහි අරය r, ගෝලයේ ද්‍රව්‍යයේ ඝනත්වය ρ_s , තරලයේ ඝනත්වය ρ_f සහ දුස්ස්‍රාවිතා සංගුණකය η ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

(ii) ආන්ත ප්‍රවේගයට ළඟා වූ පසු ගෝලය H සිරස් උසක් ගමන් කරන්නේ නම් ඒ සඳහා ගතවන කාලය T සඳහා සමීකරණයක් v_t සහ H ඇසුරෙන් ලියා දක්වන්න.

(iii) I. ඝනත්වය $8000\,kg\,m^{-3}$ ද්‍රව්‍යයකින් සාදන ලද අරය $5{\cdot}0\,mm$ වන වානේ ගෝලයක් දුස්ස්‍රාවිතා සංගුණකය $1{\cdot}0\,Pa\,s$ සහ ඝනත්වය $800\,kg\,m^{-3}$ වන තරලයක මුදා හරිනු ලැබේ. ආන්ත ප්‍රවේගයට ළඟා වූ පසු, ගෝලය ස්විච්චිය සක්‍රිය කිරීමට පෙර $0{\cdot}50\,m$ ක දුරක් ගමන් කරයි. ආන්ත ප්‍රවේගයට ළඟා වූ පසු ගෝලය ස්විච්චිය සක්‍රිය කිරීමට ගතවන කාලය ගණනය කරන්න.

II. එකම ද්‍රව්‍යයකින් සාදන ලද A සහ B ගෝල දෙකක, B ගෝලයේ අරය Aට වඩා අඩුය. ගෝල දෙක එකවර නළය තුළ නිශ්චලව මුදා හරිනු ලැබේ. මුලින්ම ස්විච්චිය සක්‍රිය කරන්නේ කුමන ගෝලය ද?

(iv) පරීක්ෂණය අතරතුර තරලයේ උෂ්ණත්වය ඉහළ ගියහොත් ඉහත (*c*) (iii) හි ගණනය කරන ලද කාලයට මෙය බලපාන ආකාරය පැහැදිලි කරන්න.

8. ආටෙමිස් II (Artemis II) මෙහෙයුම 2026 අප්‍රේල් 1 සිට අප්‍රේල් 10 දක්වා සිදු විය. එය ඔරියන් (Orion) අභ්‍යවකාශ යානයේ පළමු කාර්ය මණ්ඩල පියාසැරිය වූ අතර එය සඳ වටා ගොස් ආපසු පැමිණෙමින් මීට පෙර කිසිදු මිනිසෙකුට වඩා දුරක් පියාසර කරමින් ඉතිහාස ගත විය. භූමියේ සිට සඳට සෘජුවම දියත් කිරීම වෙනුවට, අභ්‍යවකාශ යානය මුලින්ම පෘථිවිය වටා කක්ෂගත වී (නැවතුම් කක්ෂය - parking orbit ලෙස හැඳින්වේ), පසුව සඳ කරා යොමුවූ ගමන් පථයකට ඇතුළු වීමට අවශ්‍ය නිශ්චිත ප්‍රවේගය ලබා ගැනීම සඳහා එහි එන්ජින් ක්‍රියාත්මක කරන ලදී.

(*a*) පෘථිවියේ කේන්ද්‍රයේ සිට අරය r වන වෘත්තාකාර කක්ෂයක පෘථිවිය වටා v_0 වේගයෙන් කක්ෂගත වී ඇති m ස්කන්ධයක් සහිත ඔරියන් අභ්‍යවකාශ යානය සලකා බලන්න. පෘථිවිය M ස්කන්ධයක් සහිත ඝන ඒකාකාර ගෝලයක් බවත් අභ්‍යවකාශ යානය ලක්ෂ්‍යයීය වස්තුවක් බවත් උපකල්පනය කරන්න. සාර්වත්‍ර ගුරුත්වාකර්ෂණ නියතය G වේ.

(i) අභ්‍යවකාශ යානයේ කක්ෂීය වේගය v_0 සඳහා සමීකරණයක් M, r සහ G ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

(ii) අභ්‍යවකාශ යානයේ කක්ෂීය ආවර්ත කාලය T නම්, $T = 2\pi\sqrt{\dfrac{r^3}{MG}}$ මගින් ලබා දෙන බව පෙන්වන්න.

(iii) අභ්‍යවකාශ යානයේ මුළු යාන්ත්‍රික ශක්තිය E සඳහා සමීකරණයක් $M, m, r,$ සහ G ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.

(iv) අරය r වූ වෘත්තාකාර කක්ෂයේ සිට අභ්‍යවකාශ යානයේ වියෝග ප්‍රවේගය v_e නම්, $v_e = \sqrt{\dfrac{2GM}{r}}$ මගින් ලබා දෙන බව පෙන්වන්න.

(v) එනයින්, v_e සඳහා සමීකරණයක් v_0 ඇසුරෙන් ලියා දක්වන්න.

(*b*) ඔරියන් අභ්‍යවකාශ යානයේ නැවතුම් කක්ෂය ඉලිප්සාකාර වුවද, එය පෘථිවි පෘෂ්ඨයේ සිට 400 km උන්නතාංශයක වෘත්තාකාර නැවතුම් කක්ෂයක පැවති බව උපකල්පනය කරන්න. පෘථිවියේ අරය $R = 6{\cdot}6\times10^6\,m$, පෘථිවියේ ස්කන්ධය $M = 6{\cdot}0\times10^{24}\,kg$. $G = 7{\cdot}0\times10^{-11}\,N\,m^2\,kg^{-2}$ ලෙස ගන්න.

(i) ඉහත (*a*) (i) හි ව්‍යුත්පන්න කළ සමීකරණය භාවිත කරමින්, නැවතුම් කක්ෂය ඔස්සේ කක්ෂගත වූ ඔරියන් අභ්‍යවකාශ යානයේ කක්ෂීය වේගය v_0 ගණනය කරන්න. $\sqrt{60} = 7{\cdot}75$ ලෙස ගන්න.

(ii) ඉහත (*a*) (iii) හි ව්‍යුත්පන්න කළ සමීකරණය භාවිත කරමින්, අභ්‍යවකාශ යානයේ මුළු යාන්ත්‍රික ශක්තිය E ගණනය කරන්න. අභ්‍යවකාශ යානයේ ස්කන්ධය $m = 3{\cdot}3\times10^4\,kg$.

(iii) යාන්ත්‍රික ශක්ති සංස්ථිතිය භාවිත කරමින්, අභ්‍යවකාශ යානය නැවතුම් කක්ෂයට පැමිණීම සඳහා පෘථිවියේ මතදී තිබිය යුතු අවම දියත් කිරීමේ වේගය v_L නම්, $v_L = \sqrt{GM\left(\dfrac{2}{R}-\dfrac{1}{r}\right)}$ මගින් ලබා දෙන බව පෙන්වන්න.

(iv) v_L හි අගය ගණනය කරන්න. $\sqrt{\dfrac{740}{11}} = 8{\cdot}2$ ලෙස ගන්න.

(v) ඉහත (*a*) (v) හි සම්බන්ධතාවය භාවිත කරමින්, නැවතුම් කක්ෂයේ සිට අභ්‍යවකාශ යානයේ වියෝග ප්‍රවේගය v_e ගණනය කරන්න. $\sqrt{2} = 1{\cdot}4$ ලෙස ගන්න.

(vi) ඉහත (*a*) (ii) හි දක්වා ඇති සමීකරණය භාවිත කරමින්, අභ්‍යවකාශ යානයේ කක්ෂීය ආවර්ත කාලය T ගණනය කරන්න. $\pi = 3$ සහ $\dfrac{42}{\sqrt{60}} = 5{\cdot}4$ ලෙස ගන්න.

(vii) එය දිනකට කක්ෂ කීයක් සම්පූර්ණ කරයි ද?

(viii) ඉහත (*b*) (i) හි ගණනය කරන ලද කක්ෂීය වේගයෙන් ඔරියන් අභ්‍යවකාශ යානයට නැවතුම් කක්ෂය වටා යාමට ගත වූ සත්‍ය කාලය එක් දිනකි. මෙයට හේතුව දෙන්න.

9. (A) කොටසට හෝ (B) කොටසට හෝ පමණක් පිළිතුරු සපයන්න.

(A) කොටස

රූපය (1) හි පෙන්වා ඇති ප්‍රේරක උදුනක් යනු වේගවත්, ගිනිදැල් නොමැති සහ කාර්යක්ෂම තාපන උපකරණයක් වන අතර එය විද්‍යුත් සන්නායක ද්‍රව්‍ය තුළ සෘජුවම තාපය ජනනය කිරීම සඳහා ප්‍රත්‍යාවර්ත චුම්බක ක්ෂේත්‍රයක් භාවිත කරයි. එය ක්‍රියා කරන්නේ විද්‍යුත් චුම්බක ප්‍රේරණය හරහා සුළි ධාරා නිර්මාණය කිරීමෙනි.

ප්‍රේරක උදුනක් මත ලෝහ බඳුනක් තබා ඇත. (2) රූපයේ දැක්වෙන්නේ බඳුනේ ඒකාකාර වෘත්තාකාර සන්නායක පතුලයි. එය අරය l සහ ඝනකම h වූ තුනී තැටියකි. ප්‍රේරක උදුන තැටියේ තලය තුළට යොමු වූ ස්‍රාව ඝනත්වය B වන චුම්බක ක්ෂේත්‍රයක් නිපදවන අතර එය $\dfrac{\Delta B}{\Delta t}$ නියත ශීඝ්‍රතාවකින් කාලය t සමග විචලනය වේ.



(1) රූපය

රූපය (2) හි දැක්වෙන පරිදි තැටියේ පිහිටා ඇති අරය r, පළල Δr සහ ඝනකම h වූ කුඩා වෘත්තාකාර තීරුවක් සලකා බලන්න.

(*a*) (i) අරය r වූ පුඩුව තුළ ප්‍රේරණය වන වි.ගා.බලය ε හි විශාලත්වය සඳහා සමීකරණයක් r සහ $\dfrac{\Delta B}{\Delta t}$ ඇසුරෙන් ලියා දක්වන්න.

(ii) තැටියේ සන්නායක ද්‍රව්‍යයේ ප්‍රතිරෝධකතාව ρ වේ. අරය r, පළල Δr සහ ඝනකම h වූ වෘත්තාකාර තීරුවේ ප්‍රතිරෝධය R සඳහා සමීකරණයක් $\rho, r, \Delta r$ සහ h ඇසුරෙන් ලියා දක්වන්න. වෘත්තාකාර තීරුවේ දිග අරය r වන පුඩුවේ පරිධිය ලෙස ගන්න.

(iii) එනයින්, තීරුවේ ප්‍රේරිත ධාරාව ΔI සඳහා සමීකරණයක් $\rho, r, \Delta r, h$ සහ $\dfrac{\Delta B}{\Delta t}$ ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න. තීරුවේ ප්‍රේරිත වි.ගා.බලය තීරුව පුරා නියත වන අතර ඉහත (*a*) (i) හි ලබාගත් ප්‍රකාශනයට සමාන බව උපකල්පනය කරන්න.

(iv) තීරුවේ තාපය ජනනය වීමේ ශීඝ්‍රතාව ΔP සඳහා සමීකරණයක් $\rho, r, \Delta r, h$ සහ $\dfrac{\Delta B}{\Delta t}$ ඇසුරෙන් ව්‍යුත්පන්න කරන්න.



(2) රූපය

(v) සම්පූර්ණ තැටිය තුළ තාපය ජනනය වීමේ ශීඝ්‍රතාව $P = \dfrac{\pi l^4 h}{8\rho}\left(\dfrac{\Delta B}{\Delta t}\right)^2$ මගින් දෙනු ලැබේ. භාජනයේ පතුල වාත්තු යකඩවලින් සාදා ඇති අතර එහි පිරිවිතර $l = 0{\cdot}1\,\mathrm{m}$, $h = 2{\cdot}0\times10^{-4}\,\mathrm{m}$ සහ $\rho = 8\times10^{-7}\,\Omega\,\mathrm{m}$ වේ. ප්‍රේරක උදුනේ දඟරය මගින් $\dfrac{\Delta B}{\Delta t} = 4000\,\mathrm{T\,s^{-1}}$ අගයක් නිපදවනු ලැබේ. භාජනයේ පතුල තුළ තාපය ජනනය වීමේ මුළු ශීඝ්‍රතාව P ගණනය කරන්න. $\pi = 3$ ලෙස ගන්න.

(*b*) සම්මත ගෘහස්ත ජව සැපයුම 50 Hz හි ක්‍රියාත්මක වේ. ප්‍රේරක උදුන් මෙය 20 kHz සිට 50 kHz පරාසයක සංඛ්‍යාතයන් දක්වා ඉහළ නංවනු ලැබේ. මෙයට හේතුව කුමක් ද?

(*c*) ප්‍රේරක උදුන් සමග මැටි භාජන භාවිත කළ හැකි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(*d*) යම් ආහාරයක් පිසීමට 1·8 kW h තාපයක් අවශ්‍ය වේ.

(i) 90% ක කාර්යක්ෂමතාවක් සහිත ප්‍රේරක උදුනක් භාවිතයෙන් **සහ**

(ii) 60% ක කාර්යක්ෂමතාවක් සහිත විදුලි උණු තැටියක් (hot-plate) භාවිතයෙන් මෙම ආහාරය පිසීමට ප්‍රධාන ජව සැපයුමෙන් කොපමණ ශක්තියක් (kW h වලින්) ලබා ගත යුතු ද?

Past Papers Wiki

(B) කොටස

කර්මාන්ත ශාලාවක යන්ත්‍රයක් ක්‍රියාත්මක කිරීම සඳහා විදුලි මෝටරයක් භාවිත කරයි. ක්‍රියාත්මක වන අතරතුර, මෝටරය අධි භාරයකට සම්බන්ධ කර ඇත්නම් හෝ එහි සිසිලන පද්ධතිය අසමත් වුවහොත් එය අධික ලෙස රත් විය හැක. උෂ්ණත්ව සංවේදකයක් මෝටර් ආවරණයට සවි කර ඇත. මෝටරයේ උෂ්ණත්වය මත රඳා පවතින කුඩා වෝල්ටීයතාවක් සංවේදකය නිපදවයි. මෝටරය සාමාන්‍ය උෂ්ණත්වයේදී, ක්‍රියාකාරීව පවතින විට සංවේදක ප්‍රතිදාන වෝල්ටීයතාව 0·04 V වේ. මෝටරයේ උෂ්ණත්වය ආරක්ෂිත සීමාවට වඩා ඉහළ ගිය විට, සංවේදක ප්‍රතිදාන වෝල්ටීයතාව 0·41 V වන අතර **උෂ්ණත්වය සමග තවදුරටත් වැඩි වේ.**

යම් සංඛ්‍යාංක පරිපථයකට සාමාන්‍ය ක්‍රියාකාරී උෂ්ණත්වයට සහ අධික ලෙස රත්වීමට අනුරූපව පිළිවෙළින් තාර්කික පහළ සහ තාර්කික ඉහළ වෝල්ටීයතා මට්ටම් අවශ්‍ය වේ.

(*a*) සංඛ්‍යාංක පරිපථයකට තාර්කික ඉහළ වෝල්ටීයතා මට්ටම නිපදවීමට ප්‍රදානය ලෙස 0·41 V, කෙලින්ම භාවිත කළ **නොහැක්කේ** මන්ද?

(*b*) රූපය (1) හි දැක්වෙන පරිදි සංවේදක ප්‍රතිදානය කාරකාත්මක වර්ධකයක අපවර්තන නොවන ප්‍රදානයට (V_{in}) සම්බන්ධ කර ඇත.
ප්‍රදාන ප්‍රතිරෝධය $R_1 = 2\,k\Omega$
ප්‍රතිපෝෂණ ප්‍රතිරෝධය $R_2 = 18\,k\Omega$
වර්ධකය පරිපූර්ණ බවත්, එහි සැපයුම් වෝල්ටීයතාව $+V_{CC} = +10\,V$ සහ $-V_{CC} = -10\,V$ බවත් සලකන්න.



(1) රූපය

(i) ස්වර්ණමය නීති භාවිත කරමින් වර්ධකයේ වෝල්ටීයතා ලාභය සඳහා සමීකරණයක් ව්‍යුත්පන්න කරන්න.
(ii) වර්ධකයේ වෝල්ටීයතා ලාභය ගණනය කරන්න.
(iii) සංවේදක ප්‍රතිදානය 0·04 V වන විට වර්ධකයේ ප්‍රතිදාන වෝල්ටීයතාව නිර්ණය කරන්න.
(iv) සංවේදක ප්‍රතිදානය 0·41 V වන විට වර්ධකයේ ප්‍රතිදාන වෝල්ටීයතාව නිර්ණය කරන්න.
(v) සංවේදක පරිපථයේ දෝෂයක් නිසා සංවේදක ප්‍රතිදානය 1·5 V දක්වා ඉහළ යයි. ඉහත (*b*) (i) හි ඇති ප්‍රකාශනය භාවිත කර අපේක්ෂිත වර්ධක ප්‍රතිදාන වෝල්ටීයතාව ගණනය කර, සැබෑ ප්‍රතිදාන වෝල්ටීයතාව මෙම අගයට සමාන විය **නොහැක්කේ** මන්දැයි පැහැදිලි කරන්න.

(*c*) රූපය (2) හි පෙන්වා ඇති පරිදි ඉහත (*b*) හි ලබාගත් වර්ධිත ප්‍රතිදානය කාරකාත්මක වර්ධක සංසන්දකයක අපවර්තන නොවන ප්‍රදානයට (V_+) සම්බන්ධ කර ඇත. මෙහි $+V_{CC} = +5\,V$ සහ $-V_{CC} = 0\,V$ වේ. කාරකාත්මක වර්ධකය පරිපූර්ණ යැයි උපකල්පනය කරන්න.



(2) රූපය

(i) පරිපථයේ අපවර්තන ප්‍රදාන වෝල්ටීයතාව V_- ගණනය කරන්න.
(ii) පහත අවස්ථා සඳහා සංසන්දකයේ ප්‍රතිදාන වෝල්ටීයතා නිර්ණය කරන්න.
I. මෝටරය සාමාන්‍ය උෂ්ණත්වයේ ක්‍රියාකාරීව පවතින විට
II. මෝටරයේ උෂ්ණත්වය ආරක්ෂිත සීමාවට වඩා ඉහළින් ඇති විට

(*d*) ඉහත (*c*) හි සංසන්දකයේ ප්‍රතිදානය, 5 V බසරයකට (buzzer) සපයනු ලබන අතර එයට 5 V ප්‍රදානයක් සපයන විට නාද වේ. බසරය සංසන්දකයේ වත්මන් ප්‍රතිදාන තත්ත්වයට පමණක් ප්‍රතිචාර දක්වයි. එබැවින්, අධික ලෙස රත්වීමකින් පසු, මෝටරය තවමත් ක්‍රියාකරුවෙකු විසින් පරීක්ෂා කර නොමැති වුවද, මෝටරයේ උෂ්ණත්වය සාමාන්‍ය පරාසයට පැමිණෙන විට බසරය නාද වීම නැවතේ. මෙම ගැටළුව විසඳීම සඳහා S-R පිළි-පොළයක් භාවිත කරයි. ක්‍රියාකරුට ඔබන බොත්තමක් සපයනු ලබන අතර, එය එබීමෙන් 5 V සංඥාවක් නිපදවයි.

(i) පිළි-පොළයෙහි ආරම්භක/පිහිටුවන (SET) ප්‍රදානයට සම්බන්ධ කළ යුතු සංඥාව සඳහන් කරන්න.
(ii) පිළි-පොළයෙහි ප්‍රත්‍යාරම්භක/යළි පිහිටුවන (RESET) ප්‍රදානයට සම්බන්ධ කළ යුතු සංඥාව සඳහන් කරන්න.
(iii) පිළි-පොළයෙහි කුමන ප්‍රතිදානය බසරයට සම්බන්ධ කළ යුතු ද?

(*e*) ක්‍රියාකරුට ප්‍රත්‍යාරම්භක ක්‍රියාවලිය ආරක්ෂිත කිරීමට අවශ්‍ය වේ. පිළි-පොළ ප්‍රත්‍යාරම්භක කළ යුත්තේ

I. මෝටරයේ උෂ්ණත්වය **ආරක්ෂිත සීමාවට වඩා පහළට** පැමිණ ඇති විට **සහ**
II. ප්‍රත්‍යාරම්භක තල්ලු බොත්තම එබූ විට **පමණි.**

C = සංසන්දකයේ ප්‍රතිදානය සහ P = ප්‍රත්‍යාරම්භක බොත්තමේ ප්‍රතිදානය ලෙස ගනිමු.

(i) පිළි-පොළයෙහි ප්‍රත්‍යාරම්භක ප්‍රදානය සඳහා තාර්කික ප්‍රකාශනයක් ලියන්න.
(ii) පිළි-පොළයෙහි (3) රූපයේ දී ඇති කට්ටි සටහන (block diagram) ඔබේ පිළිතුරු පත්‍රයට පිටපත් කර ගන්න. කට්ටි සටහන මත C, P සහ සුදුසු තාර්කික ද්වාර දෙකක් පමණක් භාවිත කරමින් සුදුසු තාර්කික පරිපථයක් අඳින්න.



(3) රූපය

PAST PAPERS WIKI

10. (A) කොටසට හෝ (B) කොටසට හෝ පමණක් පිළිතුරු සපයන්න.

(A) කොටස

(*a*) (i) චාල්ස් නියමයෙන් සහ පීඩන නියමයෙන් පටන් ගෙන, n මවුල සංඛ්‍යාවක් සඳහා $PV = nRT$ පරිපූර්ණ වායු සමීකරණය ව්‍යුත්පන්න කරන්න. අනෙකුත් සංකේතවලට ඒවායේ සුපුරුදු තේරුම් ඇත.

(ii) සංවෘත පද්ධතියක් සඳහා තාපගති විද්‍යාවේ පළමු නියමය $\Delta Q = \Delta U + \Delta W$ වේ. ඉහත සමීකරණයේ ඇති එක් එක් පදය හඳුන්වන්න.

(*b*) සූර්ය තාප බලාගාරයක දර්පණ භාවිත කර ආදායකයක් (receiver) වෙත සූර්ය විකිරණ යොමු කරනු ලැබේ. ඝර්ෂණයෙන් තොරව චලනය වන පිස්ටනයක් සවිකරන ලද සිලින්ඩරයක් සහිත එන්ජිමක් තුළ අඩංගු නිශ්චිත ස්කන්ධයකින් යුත් පරිපූර්ණ වායුවක් වෙත ආදායකයේ මෙම රැස් කරගත් තාප ශක්තිය ලබා දේ. සැපයෙන තාප ශක්තිය හේතුවෙන් වායුව ප්‍රසාරණය වී ප්‍රයෝජනවත් කාර්යයක් සිදු කරයි. සිසිලන ක්‍රියාවලියේදී සිලින්ඩරය වටා ඇති ජලය වෙත තාප ශක්තිය මාරු වන අතර, එමගින් වායුවට එහි මුල් අවස්ථාවට නැවත පැමිණීමට හැකි වේ. විදුලි ජනක යන්ත්‍රයක් ක්‍රියාත්මක කිරීමට පිස්ටනයේ ඉදිරි සහ පසුපස චලිතය භාවිත කෙරේ. පරිපූර්ණ තත්ත්ව යටතේ ක්‍රියාත්මක වන එවැනි එන්ජිමක, එක් සම්පූර්ණ චක්‍රයක් සඳහා වන පීඩන (P) - පරිමා (V) රූප සටහන රූපයේ දැක්වේ. A, B සහ C ලක්ෂ්‍යවල පීඩන, පරිමා සහ නිරපේක්ෂ උෂ්ණත්ව පිළිවෙළින් P_A, P_B සහ P_C, V_A, V_B සහ V_C සහ T_A, T_B සහ T_C වේ.



(i) $A \rightarrow B$ සහ $B \rightarrow C$ මගින් නිරූපණය වන තාපගතික ක්‍රියාවලි හඳුනාගන්න.

(ii) $C \rightarrow D$ සහ $D \rightarrow A$ ක්‍රියාවලි සිසිල් වීමේ හෝ රත් වීමේ ක්‍රියාවලියක් දැයි සඳහන් කරන්න.

(iii) $\frac{T_C}{T_A}$ අනුපාතය ගණනය කරන්න.

(*c*) $A \rightarrow B$ ක්‍රියාවලියේදී වායුව මගින් අවශෝෂණය කරගන්නා තාපය $\Delta Q_{AB} = n\frac{3}{2}R(T_B - T_A)$ මගින් ලබා දේ. මෙහි n යනු පරිපූර්ණ වායුවේ මවුල සංඛ්‍යාව වේ.

(i) $\Delta Q_{AB} = \frac{3}{2}V_A(P_B - P_A)$ ලෙසින් ලිවිය හැකි බව පෙන්වන්න.

(ii) එමගින් ΔQ_{AB} ගණනය කරන්න.

(iii) වායුවේ අභ්‍යන්තර ශක්තියේ වැඩිවීම ΔU_{AB} කොපමණ ද?

(*d*) $B \rightarrow C$ ක්‍රියාවලියේදී වායුව මගින් අවශෝෂණය කරගන්නා තාපය $\Delta Q_{BC} = n\frac{5}{2}R(T_C - T_B)$ මගින් ලබා දේ.

(i) P_B, V_C සහ V_B ඇසුරෙන් ΔQ_{BC} සඳහා සමීකරණයක් ව්‍යුත්පන්න කරන්න.

(ii) එමගින් ΔQ_{BC} ගණනය කරන්න.

(iii) $B \rightarrow C$ ක්‍රියාවලිය තුළදී වායුව මගින් කරන ලද කාර්යය ΔW_{BC} ගණනය කරන්න.

(iv) එනයින් වායුවේ අභ්‍යන්තර ශක්තියේ වැඩිවීම ΔU_{BC} ගණනය කරන්න.

(*e*) (i) එක් සම්පූර්ණ චක්‍රයක් තුළ වායුව මගින් සිදුකරන සඵල කාර්යය ΔW_{net} ගණනය කරන්න.

(ii) එමගින් සම්පූර්ණ චක්‍රයේ තාප කාර්යක්ෂමතාවය η ගණනය කරන්න. ඔබේ පිළිතුර ප්‍රතිශතයක් ලෙස ආසන්නතම පූර්ණ සංඛ්‍යාවට දෙන්න.

(iii) සූර්ය ප්‍රවිකිරණය මගින් තාප බලාගාරයට 10 000 W තාප ක්ෂමතාවක් ලැබේ. බලාගාරය මගින් නිපදවන යාන්ත්‍රික ක්ෂමතාව කොපමණ ද?

(*f*) මාස කිහිපයක් ක්‍රියාත්මක වීමෙන් පසු සූර්ය තාප විදුලි බලාගාරයේ ආලෝකය පරාවර්තනය කරන දර්පණ මත දූවිලි තැන්පත් වේ. ඉහත දැක්වෙන P - V රූප සටහනේ කුමන ආකාරයේ වෙනස්කම් ඔබ බලාපොරොත්තු වන්නේ ද?

Past Papers Wiki
PAST PAPERS WIKI
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(B) කොටස

සින්ක්‍රොට්‍රෝනයක් (synchrotron) යනු විශේෂිත පර්යේෂණ පහසුකමක් වන අතර එහිදී ඉලෙක්ට්‍රෝන ආලෝකයේ වේගයට ආසන්න වේගයකට වේගවත් කර වෘත්තාකාර ගබඩා වළල්ලක ගබඩා කෙරේ. චුම්බක ක්ෂේත්‍ර මගින් ඉලෙක්ට්‍රෝන අඛණ්ඩව උත්ක්‍රමය වන බැවින්, ඒවා සින්ක්‍රොට්‍රෝන විකිරණ (SR) ලෙස හඳුන්වන තීව්‍ර විද්‍යුත් චුම්බක විකිරණ විමෝචනය කරයි. මෙම විකිරණ විද්‍යුත් චුම්බක වර්ණාවලියේ පුළුල් පරාසයක තරංග ආයාම ආවරණය කරයි. මෙම විකිරණ පර්යේෂණ මධ්‍යස්ථාන වෙත යොමු කරනු ලබන අතර එහිදී එය ද්‍රව්‍ය විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව සහ නැනෝ තාක්ෂණය පිළිබඳ පර්යේෂණ සඳහා භාවිත කරයි. සින්ක්‍රොට්‍රෝන විකිරණවලට ඉතා ඉහළ පෝටෝන ස්‍රාවයක් ඇති බැවින්, දැඩි විකිරණ ආරක්ෂිත ක්‍රියා පටිපාටි අනුගමනය කරනු ලැබේ. සින්ක්‍රොට්‍රෝනයක සරල කළ සැකැස්මක් රූපයේ පෙන්වයි.



(ගණනය කිරීම් සඳහා $hc = 1240$ eV nm ලෙස ගන්න, මෙහි h යනු ප්ලාන්ක් නියතය වන අතර c යනු ආලෝකයේ වේගයයි. තවද, $1\ \text{eV} = 1{\cdot}6\times10^{-19}$ J සහ ඉලෙක්ට්‍රෝන ආරෝපණය $= 1{\cdot}6\times10^{-19}$ C)

(a) ගබඩා වළල්ලේ ඉලෙක්ට්‍රෝන $5{\cdot}0\times10^{12}$ ක් අඩංගු වේ. සෑම ඉලෙක්ට්‍රෝනයක්ම තත්පරයකට පරිභ්‍රමණ $2{\cdot}0\times10^{6}$ ක් සම්පූර්ණ කරයි. මෙම ඉලෙක්ට්‍රෝන චලනය කදම්බ ධාරාව ලෙස හඳුන්වන විද්‍යුත් ධාරාවක් ඇති කරයි.

(i) ගබඩා වළල්ලේ ස්ථාවර ලක්ෂ්‍යයක් හරහා එක් තත්පරයකදී ගමන් කරන මුළු ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව නිර්ණය කරන්න.

(ii) එනයින් ගබඩා වළල්ලේ කදම්බ ධාරාව නිර්ණය කරන්න.

(b) නොයෙකුත් පර්යේෂණාත්මක යෙදුම් සඳහා විවිධ තරංග ආයාම සහ පෝටෝන ශක්ති පරාස සහිත විකිරණ ලබා ගැනීම සඳහා විවිධ පර්යේෂණ ස්ථාන නිර්මාණය කර ඇත. සින්ක්‍රොට්‍රෝන පහසුකමක් දී ඇති තරංග ආයාම පරාසයන්හි විද්‍යුත් චුම්බක විකිරණ භාවිත කරන පර්යේෂණ ස්ථාන තුනක් ක්‍රියාත්මක කරයි.

පර්යේෂණ ස්ථානය	තරංග ආයාම පරාසය
A	1×10^{-10} m - 1×10^{-8} m
B	1×10^{-8} m - 4×10^{-7} m
C	7×10^{-7} m - 1×10^{-4} m

එක් එක් තරංග ආයාම පරාසයට අනුරූප වන විද්‍යුත් චුම්බක වර්ණාවලියේ කලාපයේ නම ලියා දක්වන්න.

(c) සින්ක්‍රොට්‍රෝන විකිරණ පර්යේෂණයකදී, කාබන් නැනෝ ද්‍රව්‍යයක් X-කිරණ පෝටෝන භාවිතයෙන් විශ්ලේෂණය කරනු ලැබේ. 310 eV ශක්තියක් සහිත පෝටෝනවලට ද්‍රව්‍යයේ කාබන් පරමාණුවල අභ්‍යන්තර කවචවලින් ඉලෙක්ට්‍රෝන ඉවත් කළ හැකි බව සොයාගෙන ඇත. පර්යේෂණයේදී විශ්ලේෂණය සඳහා භාවිත කරන X-කිරණ කදම්බයට 9·92 mW ක්ෂමතාවක් ඇති අතර නියැදිය මතුපිට $2{\cdot}0\times10^{-6}\ \text{m}^2$ ක වර්ගඵලයක් මතට එය යොමු කෙරේ.

(i) මෙම පෝටෝන ශක්තියට අනුරූප වන තරංග ආයාමය නිර්ණය කරන්න.

(ii) තත්පරයකට නියැදිය මතට පතනය වන පෝටෝන සංඛ්‍යාව නිර්ණය කරන්න.

(iii) නියැදිය මත පෝටෝන ස්‍රාවය (ඒකක වර්ගඵලයක් මතට තත්පරයකදී පතනය වන පෝටෝන සංඛ්‍යාව) නිර්ණය කරන්න.

(d) සාම්ප්‍රදායික X-කිරණ නළයක, අධි ශක්ති ඉලෙක්ට්‍රෝන, ඇලුමිනියම් ඉලක්කයක් දෙසට ත්වරණය කරයි. ඇලුමිනියම් පරමාණුවක ඉහළ ශක්ති මට්ටමක ඇති ඉලෙක්ට්‍රෝනයක් අභ්‍යන්තර කවචයක හිස්තැනක් පුරවන විට ලාක්ෂණික X-කිරණ විමෝචනය වේ. ඇලුමිනියම් සඳහා, ඉහළ සහ පහළ මට්ටම්වල ශක්ති පිළිවෙළින් $E1 = -74$ eV සහ $E2 = -1624$ eV නම් විමෝචනය වන ලාක්ෂණික X-කිරණ පෝටෝනයේ ශක්තිය ගණනය කරන්න.

(e) ලාක්ෂණික X කිරණවලට වඩා සින්ක්‍රොට්‍රෝන X කිරණ විකිරණයේ **එක්** වාසියක් සඳහන් කරන්න.

(f) සින්ක්‍රොට්‍රෝන පහසුකම් විකිරණ පාලිත ප්‍රදේශ ලෙස නම් කර ඇත. ගබඩා වළල්ල අසල නිපදවන විකිරණ පර්යේෂණ ස්ථානයක් දෙසට ගමන් කළ හැකිය. එබැවින්, ගබඩා වළල්ල සහ පර්යේෂණ ස්ථාන අතර ආවරණ ද්‍රව්‍ය ස්ථාපනය කර ඇති අතර, වැඩ කරන පිරිස් පුද්ගලික මාත්‍රාමාන පැළඳ සිටී.

ආවරණ ද්‍රව්‍ය නොමැතිව සඵල මාත්‍රා ශීඝ්‍රතාව 0·40 mSv day^{-1} වේ. ආවරණ ද්‍රව්‍යය සෑම 2·0 cm ඝනකමක්ම සඵල මාත්‍රා ශීඝ්‍රතාව එහි පවතින අගයෙන් හරි අඩකට අඩු කරයි.

(i) ආවරණ 4·0 cm ඝනකමක් හරහා ගමන් කිරීමෙන් පසු සඵල මාත්‍රා ශීඝ්‍රතාව ගණනය කරන්න.

(ii) පර්යේෂණ ස්ථානයේ සේවය කරන පර්යේෂකයෙකුට මෙම අඩු කළ සඵල මාත්‍රා ශීඝ්‍රතාව ලැබේ. දිනකට පැය 8 බැගින් වැඩ කරන දින 99ක් තුළ ලැබුණු මුළු සඵල මාත්‍රාව ගණනය කරන්න.

WWW.PastPapers.WiKi

* * *

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library